ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# 2025 සහ ඉදිරිය සඳහා

## ශ්‍රී ලංකා මහ බැංකුවේ

# ප්‍රතිපත්ති ප්‍රකාශය

75 YEARS
STABILITY FOR PROSPERITY
1950-2025

## පටුන


පූර්විකාව ........................................ 2

**1. 2024 වසරේ ආර්ථික හා මූල්‍ය අංශයේ කාර්යසාධනය** ........................................ 3

2. මිල ස්ථායීතාවය සඳහා සහාය වන ප්‍රතිපත්ති ........................................ 9

*සාරාංශය* ........................................ 9

2.1. මුදල් ප්‍රතිපත්තිය සහ ඉදිරි දැක්ම ........................................ 9

2.2. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම ........................................ 11

2.3. විදේශීය අංශයේ ස්ථායීතාවය පවත්වා ගැනීම ........................................ 13

**3. මූල්‍ය පද්ධති ස්ථායීතාවය අරමුණු කරගත් ප්‍රතිපත්ති** ........................................ 16

*සාරාංශය* ........................................ 16

3.1. බැංකු අංශයේ ප්‍රතිපත්ති ........................................ 16

3.2. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි ප්‍රතිපත්ති ........................................ 17

3.3. සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ........................................ 18

3.4. තිරසාර මූල්‍ය යටතේ වන මුලපිරීම් ........................................ 19

3.5. ගෙවීම් සහ පියවීම් පද්ධති ........................................ 19

3.6. මූල්‍ය පාරිභෝගික සබඳතා වැඩිදියුණු කිරීම ........................................ 21

**4. මහ බැංකුවේ අනෙකුත් ප්‍රතිපත්ති සහ කාර්යයන්** ........................................ 22

*සාරාංශය* ........................................ 22

4.1. මූල්‍ය අන්තර්ගතභාවය ........................................ 22

4.2. රාජ්‍ය ණය කළමනාකරණය ........................................ 23

4.3. විදේශ විනිමය කළමනාකරණය ........................................ 23

4.4. මූල්‍ය බුද්ධි ඒකකය ........................................ 24

4.5. සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය ........................................ 25

4.6. මහ බැංකුවේ සන්නිවේදන උපාය මාර්ගය ........................................ 26

4.7. මහ බැංකුවේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම ........................................ 27

5. රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය ........................................ 28

6. සමාප්ති සටහන ........................................ 30

## පූර්විකාව

ඉතිහාසයේ වාර්තා වූ දරුණුතම ආර්ථික අර්බුදයට මුහුණ දුන් ශ්‍රී ලංකාව මේ වන විට කැපී පෙනෙන ලෙස යථා තත්ත්වයට පත්ව ඇත. තීරණාත්මක ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ සාමූහික ප්‍රයත්න තුළින් ළඟාකරගත් සාර්ව ආර්ථික ස්ථාවරත්වය, ශක්තිමත් සහ වඩා ඔරොත්තු දෙන ආර්ථිකයක් නිර්මාණය කිරීම සඳහා පදනම සකස් කළේය. යළි ස්ථාපිත වූ ස්ථායීතාවය උපයෝගී කර ගනිමින්, ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය අඛණ්ඩව ඉදිරියට ගෙන යන අතර, රටෙහි ආර්ථික ස්වාරක්ෂක, ආයතන සහ පාලනය ශක්තිමත් කර ගනිමින් සහ ඇති විය හැකි කම්පනයන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම මගින් රට සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගනිමින් සිටී. එමෙන්ම, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි (ජා.මූ. අරමුදල) විස්තීර්ණ ණය පහසුකම් වැඩපිළිවෙලෙහි ද කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ගෙන ඇත. දේශීය ආර්ථික ක්‍රියාකාරකම් බලාපොරොත්තු වූවාට වඩා වැඩි වේගයකින් යථා තත්ත්වයට පත්වීම සඳහා ව්‍යාපාර සහ පාරිභෝගික විශ්වාසය නැවත වර්ධනය වීමට සහාය විය. ඉහළ උද්ධමන කාලපරිච්ඡේදයකින් පසුව සාමාන්‍ය මිල මට්ටම් අඩු වී ඇති අතර, මෙය ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය අඛණ්ඩව පවත්වාගෙන යාමට පහසුකම් සලසයි. නම්‍යශීලී විනිමය අනුපාතික ක්‍රමයක් යටතේ විදේශ විනිමය ගලා ඒම ඉහළ යෑමේ සහායෙන් බාහිර ස්වාරක්ෂක වර්ධනය කර ඇත. එමෙන්ම, රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනයේ සැලකිය යුතු දියුණුවක් දක්නට ලැබීමත් සමඟම, දිළිඳු සහ අවදානමට ලක්වූවන් සඳහා ලබා දෙන සහයෝගය වැඩිදියුණු කිරීමේ ප්‍රයත්න වැඩි විය. නියාමන රාමුව ශක්තිමත් කිරීම, ඉහළ අවදානම් කළමනාකරණය හා අධීක්ෂණය තුළින් මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ශක්තිමත් විය. මෙම ජයග්‍රහණ, ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කිරීමේ දී සාමාන්‍ය ජනතාව ඇතුළු ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන් විසින් දක්වන ලද අඛණ්ඩ දායකත්වය, නොපසුබට උත්සාහය සහ කැපකිරීම්වල ප්‍රතිඵල වේ. විශේෂයෙන්ම, මෙම පියවර ආයෝජකයින්ගේ විශ්වාසය යථා තත්ත්වයට පත් කිරීමට සහ ආර්ථිකයේ දිගුකාලීන පරිවර්තනය සඳහා පදනමක් සැකසීමට උපකාරී වී ඇත. පොදුවේ බොහෝ අංශවල ස්ථාවරත්වයක් අත්කරගෙන ඇති බැවින්, ඉදිරි කාලයේ දී අවධානය තිරසාර වර්ධනයක් ඇති කිරීම සඳහා යොමු කළ යුතු අතර, ඒ සඳහා, දැඩි ප්‍රයත්නයක් තුළින් ළඟා කරගත් ස්ථාවරත්වයට හානි නොවන පරිදි, නවෝත්පාදනයන්ට අනුබල දීම, ඵලදායීතාව ඉහළ නැංවීම, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සඳහා දැඩි කැපවීමෙන් කටයුතු කිරීම සහ පාර්ශ්වකරුවන් අතර ඉහළ සහයෝගීතාවකින් කටයුතු කිරීම සඳහා දිරි දීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකා මහ බැංකු පනත මගින් නියම කර ඇති පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය මිල ස්ථායීතාව පවත්වා ගැනීමට සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සුරක්ෂිත කිරීමට කැපවන අතර, එමගින් ආර්ථිකයේ සියලුම පාර්ශ්වකරුවන්ගේ සාර්ථකත්වය සඳහා සහාය ලබා දෙන පරිසරයක් නිර්මාණය කිරීමේ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරනු ඇත. මහ බැංකුව සිය **75 වැනි සංවත්සරය** සමරන මේ මොහොතේ, **සෞභාග්‍යය උදෙසා ස්ථාවරත්වය** පවත්වා ගැනීම කෙරෙහි වැඩි අවධානයක් සහ ප්‍රයත්නයක් යොදනු ඇත.

## 1. 2024 වසරේ ආර්ථික හා මූල්‍ය අංශයේ කාර්යසාධනය

**2024 වසර තුළ දී, ශ්‍රී ලංකා ආර්ථිකය සාර්ව ආර්ථික ස්ථායීතාව නැවත අත්කර ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගත්තේය.** ආර්ථික තත්ත්වය ස්ථායී කිරීමට සහාය වෙමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා. මූ. අරමුදල) සමඟ ඇතිකරගත් විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන ඉදිරියට ගෙන යන ලදී. රට ආර්ථිකමය වශයෙන් යථා තත්ත්වයට පත්වීමේ ගමන් මගෙහි ප්‍රධාන සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2024 වසර අවසානය වන විට ණයහිමියන් සහ බාහිර හවුල්කරුවන් සමඟ සබඳතා සාමාන්‍ය තත්ත්වයට පත් වීමට මග පාදමින් **රජය විසින්, ඉතා කුඩා ණය කොටසක් හැරෙන්නට, ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සාර්ථක ලෙස සම්පූර්ණ කරන ලදී.** මෙම වර්ධනයන්ට අනුරූපව ප්‍රමුඛ පෙළේ ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන දෙකක් විසින් **ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම ඉහළ දැමීමට කටයුතු කළ අතර,** එමගින් රටේ අවදානම් වාරිකය සැලකිය යුතු ලෙස පහළ ගියේය.

**2024 වසරේ දී උද්ධමනය ක්‍රමයෙන් පහළ ගිය අතර වසරේ අග භාගයේ දී අවධමන මට්ටම් කරා ළඟා විය.** එකතු කළ අගය මත බදු වැඩි කිරීම සහ පාරිභෝගික භාණ්ඩ හා සේවා පැසෙහි ඇති අයිතම කිහිපයකින් එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම හේතුවෙන් 2024 වසරේ මුල් භාගයේ දී මතුපිට උද්ධමනයේ තාවකාලික ඉහළ යෑමක් සිදුවිය. කෙසේ වෙතත්, ඉන් පසුව, පුරෝකථනය කළ ප්‍රමාණයට වඩා බලශක්ති මිල පහළ දැමීම, රුපියල ශක්තිමත් වීම මෙන්ම ආහාර මිල පහළ යෑම හේතුවෙන් උද්ධමනය 5%ක ඉලක්කයට වඩා පහළ ගියේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී, මතුපිට උද්ධමනය වසර නවයකට පසු පළමු වරට අවධමන මට්ටම් කරා ළඟා විය. මේ අතර, ආර්ථිකයේ ඉල්ලුම් පීඩනය ප්‍රධාන වශයෙන් පිළිබිඹු කරන මූලික උද්ධමනය ද අඩු මට්ටමේ ධන අගයක් කරා ළඟා විය.

**මතුපිට උද්ධමනයේ සැලකිය යුතු ලෙස අඩුවීම සහ ඉන් අනතුරුව සිදු වූ අවධමනය සමඟ, 2024 වසරේ දෙවන හා තෙවන කාර්තුවල දී උද්ධමනය අනුක්‍රමික කාර්තු දෙකක් සඳහා උද්ධමන ඉලක්කයේ පහළ ආන්තිකයෙන් අපගමනය විය.** 2024 වසරේ අවසාන කාර්තුවේ දී ද එවැනි උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීමක් සිදු විය. ඒ අනුව, මුදල් ප්‍රතිපත්ති රාමු ගිවිසුම යටතේ එකඟ වී ඇති පරිදි, මහ බැංකුව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා වාර්තාවක් ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. උද්ධමනය ඉලක්කයෙන් අපගමනය වීමට හේතු, උද්ධමනය නැවත ඉලක්කගත මට්ටමට ගෙන ඒම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සහ ඒ සඳහා ගත වන කාල සීමාව පිළිබඳ ඇස්තමේන්තුවක් මෙම වාර්තාවට ඇතුළත් වේ. **පාර්ලිමේන්තුවට සහ මහජනතාවට මහ බැංකුවේ වගවීම තවදුරටත් තහවුරු කිරීමේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින්** මෙම වාර්තාව මහජනතාව වෙත ද නිකුත් කෙරෙනු ඇත.

**2023 වසරේ දෙවන භාගයේ සිට නිරීක්ෂණය වූ ආර්ථිකයේ යථා තත්ත්වයට පත් වීමේ ප්‍රවණතාව අඛණ්ඩව පවත්වා ගනිමින්, ශ්‍රී ලංකා ආර්ථිකය 2024 වසරේ දී ශක්තිමත් ලෙස යථා තත්ත්වයට පත් වූ අතර, ආරම්භයේ දී පදනම් බලපෑම මෙයට මූලික වශයෙන් හේතු වූ නමුත් ලිහිල් මුදල් ප්‍රතිපත්තිය සහ අඩු උද්ධමන පරිසරය ද මෙයට සහාය විය.** 2024 වසරේ පළමු කාර්තු තුන තුළ දී, ප්‍රධාන ආර්ථික අංශවල වර්ධනයක් වාර්තා කරමින් ආර්ථිකය සැලකිය යුතු ලෙස 5.2%කින් වර්ධනය වී ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ආර්ථික ක්‍රියාකාරකම්වල පැවති වර්ධනය තවදුරටත් පවත්වා ගෙන යමින්, කර්මාන්ත සහ සේවා අංශවලට අදාළ ප්‍රමුඛ ආර්ථික දර්ශක මගින් 2024 වසරේ අවසාන කාර්තුවේ දී නිෂ්පාදිතය අඛණ්ඩව වර්ධනයවන බව පෙන්නුම් කරයි. ඒ අනුව, මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2017 වසරේ සිට වාර්තා කළ ඉහළම වාර්ෂික වර්ධනය වාර්තා කරමින් 2024 වසරේ දී 5.0%කින් පමණ වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. මෑත මාසවල දක්නට ලැබුණු අවධමනය ඉල්ලුම් සාධකවල ප්‍රතිඵලයක් ලෙස නොව ප්‍රධාන වශයෙන් පාලන මිල ගණන් ගැළපීම ඇතුළු සැපයුම් පාර්ශ්වීය සාධකවල ප්‍රතිඵලයක් වන බව, අපේක්ෂිත මට්ටම අභිබවා දක්නට ලැබුණු ඉහළ ආර්ථික වර්ධනය මගින් ද පෙන්නුම් කෙරේ.

**හිතකර උද්ධමන පරිසරය මෙන්ම සාර්ව ආර්ථික ස්ථායීතාවය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත් වීමත් සමඟ 2024 වසර තුළ දී මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තිය වඩාත් ලිහිල්ව පවත්වා ගෙන යන ලදී.** ඒ අනුව, 2024 වසරේ අවස්ථා තුනක දී මහ බැංකුව විසින් සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය ලිහිල් කරන ලදී. ඒ හේතුවෙන්, වෙළඳපොළ පොලී අනුපාතික සැලකිය යුතු ලෙස පහළ ගිය අතර එමගින් මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීම්වල බලපෑම වැඩි වශයෙන් සමස්ත ආර්ථිකය වෙත සම්ප්‍රේෂණය කිරීමට හැකි විය. 2024 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සමස්තයක් ලෙස අතිරික්ත මට්ටම්වල පැවති අතර, මනාව ක්‍රියාත්මක කළ වෙළඳපොළ මෙහෙයුම් මගින් සහාය ලබමින් කෙටි කාලීන මුදල් වෙළඳපොළ පොලී අනුපාතික මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හා අනුකූලව පවත්වා ගෙන යන ලදී. අඩු පොලී අනුපාතික පරිසරය මෙන්ම වෙළඳපොළ තුළ පැවති ප්‍රමාණවත් මට්ටමේ ද්‍රවශීලතාව මගින් ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා සහාය සැපයිණි. ඒ අනුව, මෙම හිතකර තත්ත්වයන් මගින් පාරිභෝගික වියදම් දිරිමත් වූ අතර ආයෝජන ප්‍රවර්ධනය කරමින් ආර්ථිකයේ යථා තත්ත්වයට පත් වීම සඳහා පදනම සැලසිණි.

**පැවති ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් හඳුන්වා දීම හේතුවෙන්, 2024 වසර මුදල් ප්‍රතිපත්ති සම්පාදනයට අදාළව මහ බැංකුවට සුවිශේෂී වසරක් විය.** 2024 වසරේ වාර්ෂික ප්‍රතිපත්ති ප්‍රකාශය මගින් දැනුම් දුන් පරිදි 2024 නොවැම්බර් මාසයේ දී මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දීම සඳහා භාවිත කරන ප්‍රධාන

**මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස "එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR)"** හඳුන්වා දෙන ලදී.

**ලිහිල් මුදල් තත්ත්වයේ සහාය ඇතිව 2024 වසරේ දී පෞද්ගලික අංශයට ලබා දුන් ණය සැලකිය යුතු ලෙස ඉහළ ගිය අතර, පෞද්ගලික අංශයේ ආයෝජනවලට අවශ්‍ය කෙරෙන මූල්‍ය සම්පත් සඳහා වැඩි අවකාශයක් ලබා දෙමින් රාජ්‍ය අංශය විසින් ලබා ගත් ණය වසර තුළ දී අඩු විය.**

**ප්‍රමාණවත් පරිදි මුදල් නෝට්ටු සහ කාසි බැංකු පද්ධතියට සැපයීම හරහා මුදල් සඳහා ඉහළ ගිය ඉල්ලුම සපුරාලීමට මහ බැංකුව කටයුතු කළේය.** එමගින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීම මධ්‍යයේ ගනුදෙනු බාධාවකින් තොරව කිරීමට හැකිවීම සහතික කෙරිණි. මහජනතාව විසින් ඩිජිටල් ගෙවීම් යොදා ගැනීම 2024 වසර තුළදී ද වේගයෙන් ඉහළ ගියේය. තවද, මාර්ගගත ගෙවීම් වේදිකාවන් හරහා රාජ්‍ය ආයතන වෙත ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් සිදු කිරීම ද 2024 වසරේ දී කැපී පෙනෙන වර්ධනයක් වාර්තා කර ඇත.

**වඩාත් ශක්තිමත් වූ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව මත පදනම්ව විදේශීය අංශය 2024 වසරේ දී එහි ධනාත්මක වර්ධනය අඛණ්ඩව පවත්වා ගෙන ගියේය.** ගෙවුම් තුලන තත්ත්වය ශක්තිමත් වී ඇති අතර, ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ වාර්තා ගත ලෙස අඛණ්ඩව වසර දෙකක දී අතිරික්තයන් වාර්තා කරමින්, ජංගම ගිණුම 2024 වසරේ දී ද අතිරික්තයක් වාර්තා කරනු ඇතැයි ඇස්තමේන්තු කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළෙන් **මෙතෙක් මිල දී ගත් ඉහළම වාර්ෂික විදේශ විනිමය (ශුද්ධ පදනම මත) ප්‍රමාණය, එනම්, එ.ජ. ඩොලර් බිලියන 2.8ක් ඉක්මවා** මිල දී ගැනීම, 2024 වසරේ දී වාර්තා විය. දළ නිල සංචිත 2023 වසර අවසානයේ වාර්තා වූ එ.ජ. ඩොලර් බිලියන 4.4ට සාපේක්ෂව **2024 වසර අවසානය වන විට එ.ජ. ඩොලර් බිලියන 6.1ක් පමණ දක්වා වැඩි විය.** මහ බැංකු පනතේ නියම කර ඇති පරිදි, නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව යටතේ නම්‍යශීලී විනිමය අනුපාතික ප්‍රතිපත්තිය 2024 වසරේ දී අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ශුද්ධ විදේශ විනිමය ලැබීම් සහ ඉහළ ගිය වෙළඳපොළ අපේක්ෂාවන් මගින් මෙහෙයවනු ලැබූ ශ්‍රී ලංකා රුපියල 2024 වසරේ දී ද අතිප්‍රමාණය වීමක් වාර්තා කිරීමත් සමඟ වැඩි ස්ථාවරත්වයක් ද පෙන්නුම් කළේය.

**මූල්‍ය පද්ධතිය 2024 වසරේ දී තවදුරටත් ශක්තිමත්ව පැවති අතර, වැඩි ස්ථාවරත්වයක් පෙන්නුම් කරන ලදී.** මූල්‍ය අංශය කෙරෙහි ආර්ථික අර්බුදය මගින් ඇතිවුණු බලපෑම ක්‍රමක්‍රමයෙන් පහව යාමත් සමඟ, වසර තුළ බැංකු අංශයේ ශක්තිමත් බව වැඩිදියුණු විය. බැංකු අංශයේ දළ ණය සහ අය විය යුතු අරමුදල් (ණය) අඛණ්ඩව වර්ධනය වූ අතර, අක්‍රීය ණය අනුපාතය අඩු වීමෙන් පිළිබිඹු වන පරිදි, එම අංශයේ ණය පැහැර හැරීමේ අවදානම වසර තුළ කැපී පෙනෙන ලෙස අඩු විය. තවද, මෙම අංශයේ ද්‍රවශීලතා ආවරණ අනුපාත අවම නියාමන අවශ්‍යතාවලට වඩා ඉහළින් පැවතුණි. 2024 වසරේ දී බැංකු අංශයේ හිමිකම් මත ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස වැඩිදියුණු විය. අවදානම්

මත බර තබන ලද වත්කම්වලට වඩා නියාමන ප්‍රාග්ධනයේ වාර්තා වූ ඉහළ වර්ධනය පිළිබිඹු කරමින් 2024 වසරේ දී බැංකු අංශයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය වැඩිදියුණු විය. මේ අතර, 2024 වසරේ දී මුදල් සමාගම් අංශයේ ද මුළු ණය සහ අත්තිකාරම් සීඝ්‍ර ලෙස යථා තත්ත්වයට පත්වීමක් වාර්තා කළ අතර, එහි ලාභදායිතා දර්ශක වැඩිදියුණු විය. සාර්ව මූල්‍ය තත්ත්වයන් සහ වෙළඳපොළ සහභාගිවන්නන්ගේ විශ්වාසය අඛණ්ඩව වැඩිදියුණු වීම නිසා මූල්‍ය වෙළඳපොළ අඩු ආතතියකින් ක්‍රියාත්මක වේ.

**මූල්‍ය ආයතනවල ආරක්ෂිත බව සහ ශක්තිමත් බව සහතික කිරීමේ අරමුණින් මහ බැංකුව මූල්‍ය අංශයේ නියාමන රාමුව ශක්තිමත් කිරීමට අඛණ්ඩව කටයුතු කළේය. බැංකු (සංශෝධන) පනත** මගින් සහ සංශෝධන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා බලපත්‍රලාභී බැංකු වෙත අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම තුළින් බලපත්‍රලාභී බැංකුවල නීතිමය සහ නියාමන රාමුව, වඩාත් ශක්තිමත් කරන ලදී. ඒ අනුව, බැංකු පනත යටතේ විශාල නිරාවරණයන්, ආයතනික පාලනය, ද්‍රවශීලතා අනුපාත, සම්බන්ධිත පාර්ශ්ව සමඟ සිදුකරන ගනුදෙනු සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර පිළිබඳ උපදෙස් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදී. තව ද, ප්‍රමාණවත් ලෙස ප්‍රාග්ධනීකරණය වූ බැංකු පද්ධතියක් හරහා මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව ශක්තිමත් කිරීමේ අරමුණින් විශාල දේශීය බැංකු නවයක් ප්‍රතිව්‍යුහගත කිරීම සහ ප්‍රාග්ධනීකරණය සඳහා වූ සැලසුමට අනුකූලව මහ බැංකුව විසින් **බැංකු ප්‍රාග්ධනීකරණ උපාය මාර්ගය** සකස් කරන ලදී. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය (Sri Lanka Deposit Insurance Scheme) යටතේ වන්දි ගෙවීමේ යාන්ත්‍රණයේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා සියලුම බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් ආවරණය වන පරිදි **තැන්පත්කරුවන් අනුව දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය** ද ආරම්භ කරන ලද අතර, එමගින් තැන්පත්කරුවන්ගේ තොරතුරුවල නිරවද්‍ය, කාලෝචිත සහ විධිමත් කළමණාකරණය සහතික කරන ලදී.

**බැංකු (විශේෂ විධිවිධාන) පනත යටතේ නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් මහ බැංකුව 2024 වසරේ දී වැදගත් සන්ධිස්ථානයක් ළඟා කර ගත්තේය.** මෙම ජයග්‍රහණ, ප්‍රතිපත්ති සම්පාදනය, නිරාකරණ සැලසුම්කරණය, දත්ත කළමනාකරණය, කම්පන හඳුනා ගැනීමේ ක්‍රමවේද ආරම්භ කිරීම සහ **මූල්‍ය ස්ථායීතා අරමුදල** ක්‍රියාත්මක කිරීම වැනි ප්‍රධාන ක්ෂේත්‍රයන් දක්වා විහිදේ. 2024 වසරේ ඔක්තෝබර් මාසයේ දී රු. මිලියන 500ක මූලික ප්‍රතිපාදනයකින් මූල්‍ය ස්ථායීතා අරමුදල රජය විසින් ස්ථාපිත කරන ලදී.

**මේ අතර, මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා මහ බැංකුව දරන උත්සාහයේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2024 වසරේ අගෝස්තු මාසයේ සිට බලපැවැත්වෙන පරිදි මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව පිළිබඳ රෙගුලාසි සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන ලදී.** 2024 වසර තුළ, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමත් සමඟ, තහනම්

මූල්‍ය යෝජනා ක්‍රම සම්බන්ධ සිද්ධීන් හැසිරවීමේ වගකීම ඒ සඳහා වෙන් වූ දෙපාර්තමේන්තුවකට පැවරිණි.

**2024 වසර තුළ, ශ්‍රී ලාංකික පදිංචිකරුවන් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත කරන ලද ආයෝජන සහ විගමනිකයන් විසින් ප්‍රාග්ධන හුවමාරු කිරීම් සඳහා පනවා තිබූ සීමා සැලකිය යුතු ලෙස ලිහිල් කරන ලදී.** මෙම සීමාවන් 2020 වසරේ සිට ක්‍රියාත්මක වුණි. එසේම, අපනයන ආදායම ශ්‍රී ලංකාවට ගෙන ඒම සහ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් පනවා තිබූ රීති ලිහිල් කෙරිණි.

**මහ බැංකුව 2024 වසර තුළ දී කලාපීය සහ වෙනත් රටවල්වල ගෙවීම් ජාල සමඟ ඒකාබද්ධ වීම මගින් ජාතික ගෙවීම් පද්ධති යටිතල පහසුකම් තවදුරටත් වැඩිදියුණු කළේය.** තවද, ශ්‍රී ලංකාවේ ගෙවීම් යටිතල පහසුකම් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීමේ අරමුණින්, නව තත් කාලීන දළ පියවීම් පද්ධතියක් (Real Time Gross Settlement system - RTGS) හඳුන්වා දීමෙන්, ප්‍රමිතිකරණය සඳහා වූ ජාත්‍යන්තර සංවිධානයෙහි ISO 20022 සම්මතය ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියෙහි පළමු අදියර සම්පූර්ණ කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකාවේ පුරවැසියන් සහ රජය අතර පවතින ගනුදෙනු වැඩිදියුණු කිරීම සහ විවිධ රාජ්‍ය සේවාවන්වලට අදාළ ගෙවීම් ක්‍රියාවලීන් විධිමත් කිරීම අරමුණු කරගත් මුලපිරීමක් වන රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව (government digital payment platform - GDPP) සකස් කිරීමේ දී මහ බැංකුව ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කළේය.

**ජා. මූ. අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ ඇති රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ගවලට අනුකූලව, මූල්‍ය තිරසාරභාවය නැවත අත්පත් කර ගැනීමේ අරමුණින් ක්‍රියාත්මක වූ රාජ්‍ය මූල්‍ය අංශයේ කාර්යසාධනය 2024 වසරේ දී ද අඛණ්ඩව වැඩිදියුණු විය.** බදු ආදායම් එකතු කිරීමේ කැපී පෙනෙන ඉහළ යාමත්, සැලකිය යුතු මට්ටමේ ප්‍රාථමික ශේෂ අතිරික්තයක් ළඟා කර ගැනීම ඇතුළු ප්‍රධාන රාජ්‍ය මූල්‍ය දර්ශක වැඩිදියුණු වීමත් සමඟ මෙම ප්‍රතිපත්තිමය ප්‍රතිසංස්කරණ රාජ්‍ය මූල්‍ය තත්ත්වය තුළ පිළිබිඹු වී ඇත. මීට අමතරව, ප්‍රධාන උපයෝගීතා සඳහා පිරිවැය පිළිබිඹු කරන මිලකරණ යාන්ත්‍රණයක් භාවිත කිරීම ඇතුළුව ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ අඛණ්ඩව පවත්වාගෙන යාම, රජය සතු වාණිජ ව්‍යාපාර මගින් රාජ්‍ය මූල්‍ය ශේෂයන් සහ බැංකු පද්ධතිය මත ඇති කරන බර අඩු කිරීමට බොහෝ දුරට සහාය වී ඇත. වෙළඳපොළ පොලී අනුපාත අඩු වෙමින් පවතින පරිසරයක් යටතේ වැඩිදියුණු වූ රාජ්‍ය මූල්‍ය කාර්යසාධනය සහ අඩු අවදානම් වාරිකය හේතුවෙන් රජයේ සුරැකුම්පත්වල ඵලදා අනුපාතිකය සැලකිය යුතු ලෙස අඩු කිරීමට උපකාරී වූ අතර එමගින් රජයට ගෙවීමට තිබූ පොලී පිරිවැය අඩු විය. තවද, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමට මහ බැංකුව දරන උත්සාහයට අනුපූරක වීම තුළින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා රාජ්‍ය මූල්‍ය විචක්ෂණභාවයේ වැදගත්කම ඉස්මතු කරයි.

# 2025 සහ ඉදිරිය සඳහා ප්‍රතිපත්ති

# 2. මිල ස්ථායීතාවය සඳහා සහාය වන ප්‍රතිපත්ති

***සාරාංශය***

- *මුදල් ප්‍රතිපත්තිය මගින් උද්ධමනය 5%ක මට්ටමේ පවත්වා ගන්නා අතර ආර්ථිකය තිරසාර වර්ධනයක් ළඟා කර ගැනීම අපේක්ෂා කරයි*
- *උද්ධමනය 2025 වසරේ මැද භාගය වන විට නැවතත් ධන අගයක් කරා ළඟා වනු ඇත*
- *ආර්ථික ක්‍රියාකාරකම් සඳහා සහාය වෙමින් පෞද්ගලික අංශයේ ණය ප්‍රසාරණය වීමේ ප්‍රවණතාවය අඛණ්ඩව පවතිනු ඇත*
- *මූල්‍ය ආයතන සමඟ එක්ව තෝරාගත් ණය උපකරණ සඳහා පවතින අධික ණය පොලී අනුපාතික අඩු කිරීමට නියමිතය*
- *ඉතුරුම් ඉහළ නැංවීම සඳහා නව්‍ය ක්‍රමවේද හඳුන්වා දීම අවශ්‍ය වේ*
- *ඉදිරි දැක්මක් සහිත සහ දත්ත පදනම් කරගත් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා තවදුරටත් වැඩිදියුණු කිරීම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ*
- *එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හා සමගාමීව කෙටිකාලීන පොලී අනුපාතික මෙහෙයවීම සඳහා මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම*
- *ද්‍රවශීලතා පුරෝකථන රාමුව වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය*
- *ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව වැඩිදියුණු කිරීමට අපේක්ෂිතය*
- *විවට වෙළඳපොළ වෙන්දේසි සඳහා කාලසටහනක් ප්‍රකාශයට පත් කිරීමට නියමිතය*
- *බාහිර ස්වාරක්ෂක යළි ගොඩනැඟීම සඳහා වන ප්‍රයත්න අඛණ්ඩව සිදු කෙරේ*
- *වෙළඳපොළ සහ මහජනතාවට මගපෙන්වීමක් ලබාදීම සඳහා පදනම් එතැන් විනිමය අනුපාතයක් හඳුන්වා දීමට නියමිතය*
- *සන්නිවේදන උපාය මාර්ගය මගින් ප්‍රතිපත්ති පිළිබඳ තොරතුරු සැම දෙනා වෙතම ළඟා වීම තහවුරු කිරීම*

## 2.1. මුදල් ප්‍රතිපත්තිය සහ ඉදිරි දැක්ම

මුදල් ප්‍රතිපත්තිය ඇතුළුව, අත්‍යවශ්‍ය වූ නිවැරදි සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම තුළින් ආර්ථිකය යථා තත්ත්වයට පත්වීමෙන් සහ ස්ථායීතාවය ළඟා කර ගැනීමෙන් අනතුරුව, මැදි කාලීනව ආර්ථිකය තිරසාර වර්ධන මාවතක ගමන් ගන්නා බව සහතික කරමින්, එමගින් ආර්ථිකයේ සෞභාග්‍යාමත්බව තහවුරු කිරීමට නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව **උද්ධමනය 5%ක ඉලක්කය වටා ස්ථායීව පවත්වා ගැනීම** සඳහා ඉදිරි කාලයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ වත්මන් පුරෝකථන අනුව සැපයුම් අංශයේ එක් වරක් පමණක් මිලෙහි ඇති වූ වෙනස්කම්වල බලපෑම් හේතුවෙන් සිදු වූ අවධමනකාරී තත්ත්වය 2025 වසරේ මුල් භාගයේ ද

පවතිනු ඇත. කෙසේ වෙතත්, එවැනි සැපයුම් අංශයේ බලපෑම් යටපත් වීම සහ ලිහිල් මුදල් ප්‍රතිපත්තියක් මගින් ඇති වූ හිතකර තත්ත්වයන් සමඟ වසරේ අවසාන භාගයේ දී උද්ධමනය එහි ඉලක්කය කරා ළඟා වනු ඇතැයි පුරෝකථනය කෙරේ. එසේ උද්ධමනය ඉලක්කය කරා ළඟා වන තෙක්, ශ්‍රී ලංකා මහ බැංකු පනතේ සඳහන් අවශ්‍යතාවය අනුව, **මහ බැංකුවේ කටයුතුවල විනිවිදභාවය සහ වගවීම සහතික කිරීමේ අරමුණින්,** උද්ධමනය අඩු මට්ටමක පැවතුණ ද, උද්ධමන ඉලක්කයෙන් විතැන් වීම සඳහා හේතු සාධක සපයමින් මහ බැංකුව විසින් පාර්ලිමේන්තුවට අවශ්‍ය විස්තර සහිත වාර්තා ඉදිරිපත් කරනු ඇත. 2021 වසරේ අග භාගයේ සිට 2023 වසරේ මුල් භාගය දක්වා වූ ඉහළ උද්ධමන කාලපරිච්ඡේදයෙන් පසුව, මෙම තාවකාලික අවධමන කාලසීමාව තුළ දී යම් ප්‍රමාණයකට ජීවන වියදම අඩු වීම සාමාන්‍ය ජනතාවට යම් සහනයක් වනු ඇතැයි විශ්වාස කෙරේ.

පවතින ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සහ ව්‍යාපාර හා ආයෝජකයින්ගේ අපේක්ෂා වර්ධනය වීම මගින් ලැබෙන්නා වූ සහාය හේතුවෙන් **2024 වසරේ දී නිරීක්ෂණය කරන ලද පෞද්ගලික අංශය වෙත ලබාදෙන ලද ණයෙහි සිදුවූ පුළුල් වර්ධනය, ඉදිරි කාල සීමාව තුළ ද අඛණ්ඩව සිදුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.** මෙමගින් ආර්ථිකයේ නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීම තුළින්, දේශීය ආර්ථික වර්ධනයට සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එසේ වුවත්, දේශීය මිල ස්ථායීතාවය පවත්වා ගැනීමේ දී ඇති විය හැකි අවදානම් සහ දුර්වලතා නිසි කලට හඳුනා ගැනීම සහ අවම කිරීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ණය සහ ඒ ආශ්‍රිත ගතිකයන්හි වර්ධනයන් සමීපව අධීක්ෂණය කරනු ඇත. කාලෝචිත මුදල් ප්‍රතිපත්ති මැදිහත්වීම මගින් පොලී අනුපාතිකවල ඉහළ උච්චාවචනයන් වළක්වනු ඇති අතර, එමගින් අභියෝගාත්මක ආර්ථික තත්ත්වයන්ට මුහුණ දෙමින් ආර්ථිකය එහි විභවය කරා ළඟා වීමට පහසුකම් සපයනු ලැබේ.

වෙළඳපොළ ණය පොලී අනුපාතික සැලකිය යුතු ලෙස අඩු වීම පෞද්ගලික අංශය වෙත ණය ලබා දීම ප්‍රකෘතිමත් වීමට සහාය වී ඇත. කෙසේ වෙතත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් මෙන්ම ආන්තික ණය ලබා ගන්නන් සහ ඇතැම් ණය පහසුකම් සඳහා ලබා දී ඇති, පවතින ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට නොගැළපෙන ඉහළ මෙන්ම අසාමාන්‍ය පොලී අනුපාතික පිළිබඳව මහ බැංකුව නිරීක්ෂණය කරයි. තවද, ආර්ථිකය යථාතත්ත්වයට පත්වීම සහ ආර්ථිකයේ දක්නට ලැබෙන සමස්ත ස්ථායීතාවය හේතුවෙන් බැංකු සහ මූල්‍ය ආයතනවල ණය ලබා දීමට ඇති කැමැත්ත වැඩිදියුණු වෙමින් පවතින අතර, ණය දීම හා සම්බන්ධ අවදානම් අඩුවෙමින් පවතී. එබැවින්, අඩු පොලී අනුපාතිකයන් යටතේ ණය ලබා ගැනීමට හැකි වන පරිදි, මහ බැංකුව **වෙළඳපොළෙහි දැනට පවතින ඉහළ පොලී අනුපාතික අඩු කිරීමට** බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන සමඟ සමීපව කටයුතු කරනු ඇත.

අඩු පොලී අනුපාතික, ණය ගැනීම් ඉහළ නැංවීමට සහ සමස්ත ව්‍යාපාරික අපේක්ෂා ඉහළ නැංවීමට දායක වී ඇති නමුත්, එමගින් ඉතිරි කරන්නන්ට අසමානුපාතික ලෙස අහිතකර බලපෑමක් ඇති කරයි. කෙසේ වෙතත්, උද්ධමනය සාර්ථකව අඩු මට්ටම් දක්වා අඩු වීමත් සමඟ ඉහළ උද්ධමන කාලපරිච්ඡේදයේ දී මෙන් නොව, තැන්පතුවලට ලැබෙන මූර්ත ප්‍රතිලාභ ධනාත්මක තත්ත්වයක පවතී. පොලී අනුපාතික හැසිරීම් චක්‍ර පවතින අතර, සමස්ත මහජන සුබසාධනය ඉහළ නැංවීමේ අරමුණින්, අඩු සහ ස්ථායී උද්ධමනයක් පවත්වා ගැනීම සහතික කිරීම සඳහා මහ බැංකුව පොලී අනුපාතික මෙහෙයවනු ඇත. මෙම ප්‍රවණතා මධ්‍යයේ, අඩු පොලී අනුපාතික පරිසරයක් තුළ දේශීය ඉතුරුම් ඉහළ නැංවීම සහතික කිරීම සඳහා, **ශීඝ්‍රයෙන් වයස්ගත වන ජනගහනයක් සිටින පසුබිමක ඉතුරුම් ඉහළ නැංවීමට නව්‍ය විසඳුම් සහ උපකරණ හඳුන්වා දෙන අතරම** ව්‍යාපාර චක්‍රය තුළ පොලී අනුපාතික වෙනස්වීම්වල බලපෑම අවම කිරීම සඳහා ද්‍රවශීලතාවය සහ ආරක්ෂාව අවධාරණය කරන අංග ඇතුළත් කිරීමට මූල්‍ය අංශය දිරිමත් කෙරේ. එපමණක් නොව, ජීවිතයේ මුල් අවධියේ දී ඉතිරි කිරීමට නැඹුරුවක් ඇති කළ යුතු අතර, එමගින් දිගුකාලීන ඉතිරිකිරීම් ඉහළ නැංවීම පමණක් නොව, විශ්‍රාම දිවියේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට තුඩු දෙන ඉහළ මූල්‍ය සුරක්ෂිතභාවය ද සහතික කෙරේ.

මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ඉදිරි දැක්මක් සහිත සහ දත්ත පදනම් කරගත් ප්‍රවේශයක් අනුගමනය කරනු ලබන අතර, එය නම්‍යශීලී උද්ධමනය ඉලක්කකරණ රාමුව යටතේ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ ආවේණික අංගයක් වේ. **සාර්ව ආර්ථික විචලයයන් පුරෝකථනය කිරීම සඳහා දැනට භාවිත වන ආකෘති වැඩිදියුණු කිරීමට මහ බැංකුව අඛණ්ඩව ක්‍රියා කරනු ලබන අතර, අනුපූරක විකල්ප ආකෘති සහ රාමු ඇගයීම ද සමගාමීව සිදු කෙරෙනු ඇත.** මීට අමතරව, **ප්‍රතිපත්ති පර්යේෂණ වැඩිදියුණු කිරීම සහ ආයතනය තුළ ශක්තිමත් පර්යේෂණ සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම ප්‍රධාන ප්‍රමුඛතා ලෙස පවතී.** උසස් තත්ත්වයේ විශ්ලේෂණ සහ නවීන තාක්ෂණයේ සහායයෙන් සිදු කෙරෙන වැඩිදියුණු කළ දත්ත එක්රැස් කිරීම් හා ඉහළ පුරෝකථන හැකියාවන් හරහා තාක්ෂණික ධාරිතාව වැඩිදියුණු කිරීමට ගනු ලබන මෙම ප්‍රයත්න මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට වඩා හොඳින් සහාය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, **කෙටි කාලීන පුරෝකථන වැඩිදියුණු කිරීම සඳහා අධි-සංඛ්‍යාත දත්තවල නව මූලාශ්‍ර ගවේෂණය කිරීම** මගින් ප්‍රතිපත්ති විශ්ලේෂණය සඳහා භාවිත කරන සිය දත්ත පරාසය පුළුල් කරනු ඇති අතර, මහ බැංකුව විසින් පවත්වනු ලබන සමීක්ෂණ ආවරණය තවදුරටත් වැඩි කෙරෙනු ඇත.

## 2.2. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මගින් නිවේදනය කරනු ලබන මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික මෙහෙයවීමේ අරමුණින් මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් සිදු කරනු ලැබේ. දැනටමත් පෙන්නුම් කරන පරිදි, තනි ප්‍රතිපත්ති පොලී

අනුපාතික ක්‍රමවේදය යටතේ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය හඳුන්වාදීම සහ ඊට සමගාමීව මුදල් ප්‍රතිපත්තිය ලිහිල් කිරීමත් සමඟ කෙටි කාලීන වෙළඳපොළ පොලී අනුපාතික, විශේෂයෙන්ම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය මට්ටමේ පවතී. මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සඵලදායීත්වය ඉහළ නැංවීම සඳහා 2025 වසර සඳහා තවත් පියවර කිහිපයක් සැලසුම් කර ඇත.

මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව කෙටි කාලීන පොලී අනුපාතික මෙහෙයවීම සඳහා දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව අඛණ්ඩව කළමනාකරණය කරනු ඇත. අපේක්ෂිත ලෙස විදේශ සංචිත ගොඩනංවාගැනීමත් සමඟ 2025 වසරේ දී දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව ක්‍රමයෙන් ඉහළ යනු ඇති අතර, **සුදුසු මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් හරහා ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට මහ බැංකුව සූදානම්ව සිටියි**. මේ අතර, ආර්ථික අර්බුදය තුළ මහ බැංකුව විසින් රජයට මූල්‍යාන පහසුකම් සැපයීමට අදාළව මිලදී ගත් දැනට මහ බැංකුව සතුව පවතින ප්‍රතිව්‍යුහගත භාණ්ඩාගාර බැඳුම්කර ක්‍රමයෙන් ඉවත් කර ගැනීමේ ක්‍රමවේද පිළිබඳව මහ බැංකුව අවධානය යොමු කරනු ඇත.

නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව සහ ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව **වත්මන් ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව සමාලෝචනය කිරීමේ ක්‍රියාවලියක මහ බැංකුව යෙදී සිටියි**. සඵලදායී ලෙස මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ සහ සමස්ත මූල්‍ය පද්ධතියේ ප්‍රයෝජනය සඳහා ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා රාමුව වැඩිදියුණු කිරීම සඳහා අදාළ පාර්ශ්වකරුවන් සමඟ සාකච්ඡාවලින් අනතුරුව අවශ්‍ය වෙනස්කම් ක්‍රියාත්මක කරනු ඇත.

තවද, තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය යටතේ මුදල් ප්‍රතිපත්තිය සඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ වෙනස්වෙන දේශීය හා ගෝලීය ප්‍රවණතාවන්ට අනුකූල වීමේ අරමුණින් **2025 වසරේ දී විවට වෙළඳපොළ කටයුතු සඳහා වඩාත් වෙළඳපොළ හිතකාමී ක්‍රමවේදයකට යොමු වීමට** මහ බැංකුව සැලසුම් කරයි. ඒ අනුව, වෙළඳපොළ සහභාගීවන්නන් අතර ද්‍රවශීලතා කළමනාකරණය පිළිබඳ නිශ්චිතභාවයක් ඇති කිරීම සඳහා **2025 වසරේ දී විවට වෙළඳපොළ වෙන්දේසි සඳහා කාලසටහනක් ප්‍රකාශයට පත් කිරීමට අපේක්ෂා කෙරේ**. මීට අමතරව, **ද්‍රවශීලතා පුරෝකථන රාමුව වැඩිදියුණු කිරීමට මහ බැංකුව කටයුතු කරන අතර නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවට අනුකූලව මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමට විකල්ප ක්‍රමවේද අධ්‍යයනය කරනු ඇත.**

තවද, 2025 වසර තුළ දී මහ බැංකුවේ විවට වෙළඳපොළ කටයුතු සහ නිත්‍ය පහසුකම්වල සඵලදායීත්වය වැඩිදියුණු කිරීමේ අරමුණින් **මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම්වල සුදුසුකම්ලත් පාර්ශ්වකරුවන් සමාලෝචනය කර විධිමත් කිරීමට** අපේක්ෂා කරයි.

මීට අමතරව, නෛතික අවශ්‍යතාවට සහ මින් පෙර පැවති භාවිතයන්ට අනුකූලව, 2025 වසර සඳහා **මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත් කිරීමේ පූර්ව දින දර්ශනය** පහත පරිදි ප්‍රකාශයට පත් කෙරේ.

**මුදල් ප්‍රතිපත්ති තීරණ ප්‍රකාශයට පත් කිරීමේ පූර්ව දින දර්ශනය - 2025**

| මුදල් ප්‍රතිපත්ති විවරණය | මුදල් ප්‍රතිපත්ති මණ්ඩල රැස්වීම | මුදල් ප්‍රතිපත්ති නිවේදනය |
|---|---|---|
| **1** | ජනවාරි 28 | **ජනවාරි 29**<br>***මුදල් ප්‍රතිපත්ති වාර්තාව - පෙබරවාරි 15*** |
| **2** | මාර්තු 25 | **මාර්තු 26** |
| **3** | මැයි 27 | **මැයි 28** |
| **4** | ජූලි 22 | **ජූලි 23**<br>***මුදල් ප්‍රතිපත්ති වාර්තාව - අගෝස්තු 15*** |
| **5** | සැප්තැම්බර් 23 | **සැප්තැම්බර් 24** |
| **6** | නොවැම්බර් 25 | **නොවැම්බර් 26** |

### 2.3. විදේශීය අංශයේ ස්ථායීතාවය පවත්වා ගැනීම

සම්පූර්ණ වීමට ආසන්න රජයේ විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සහ ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන යටතේ ලබාගෙන ඇති සැලකිය යුතු ප්‍රගතිය මගින් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීමට සහ විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීමට අවශ්‍ය ශක්තිමත් පදනමක් නිර්මාණය කර ඇත. මේ සම්බන්ධයෙන්, සුදුසු ප්‍රතිපත්ති ඉතා කඩිනමින් ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව විදේශීය අංශයේ වර්ධනයන් සහ අවදානම් සමීපව නිරීක්ෂණය කරනු ඇත.

2023 සහ 2024 යන වසර දෙකේ දී ජංගම ගිණුමේ අඛණ්ඩව අතිරික්තයක් වාර්තා කිරීමට ශ්‍රී ලංකාව සමත් වී ඇත. කෙසේ වෙතත්, ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ යැමත් සමඟ 2025 වසරේ දී විදේශීය ජංගම ගිණුමේ හිඟයක් වාර්තා කිරීමට ඉඩ ඇත. **මැදි කාලීනව විදේශීය ජංගම ගිණුම තිරසාර මට්ටමින් පවත්වාගෙන යැම** ශ්‍රී ලංකාවට අවශ්‍ය වේ. විශේෂයෙන්ම රජය විසින් 2025 දී වාහන ආනයන සීමා ලිහිල් කිරීමට සැලසුම් කර ඇති තත්ත්වයක් තුළ ආනයන වියදම්

ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ඉතිහාසයේ වාර්තා වූ ඉහළම අගයන් වෙත ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරෙන සේවා වෙළඳාමේ ලැබීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ විදේශීය ජංගම ගිණුම ශක්තිමත් කිරීම සඳහා දායක වනු ඇත.

ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සහ සමස්ත සාර්ව ආර්ථික ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා දැනට ක්‍රියාත්මක **ජා. මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම් වැඩසටහන** මත විදේශීය අංශයේ දිගු කාලීන ස්ථාවරත්වය තහවුරු කිරීම සඳහා වූ ඉදිරි ගමන අත්‍යවශ්‍යයෙන්ම රඳා පවතිනු ඇත. විදේශ විනිමය වෙළඳපොළ වෙතින් විදේශ විනිමය මිලදී ගැනීම මගින් වැඩසටහන යටතේ ප්‍රධානතම වගකීමක් වන **බාහිර ස්වාරක්ෂක නැවත ගොඩනැගීමට** මහ බැංකුව අඛණ්ඩව උත්සාහ දරනු ඇත. වර්ධනය වූ වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම්, විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ විදේශීය සෘජු ආයෝජන මගින් රටට ප්‍රමාණවත් විදේශ විනිමය ලැබීම් තුළ එවැනි බාහිර ස්වාරක්ෂක ගොඩනැගීමට පහසුකම් සැලසිය යුතුය. තවද, සංචිත කළමනාකරණ කටයුතු පුළුල් කිරීමේ අරමුණින්, **වඩා දියුණු ආයෝජන කළඹ කළමනාකරණ උපාය මාර්ග සහිත නව ආයෝජන අරමුදලක් ස්ථාපිත කිරීම** වැනි වෙළඳපොළ තුළ සිදු කරන විවිධ විවිධාංගීකරණ උපාය මාර්ග හරහා වෙළඳපොළ අවස්ථා ප්‍රයෝජනයට ගැනීමට මහ බැංකුව අදහස් කරයි. ආයෝජනය කරන ලද විදේශ සංචිතවල ආරක්ෂාව සහතික කිරීම සඳහා අවදානම් අවම කිරීමේ ක්‍රමවේද ශක්තිමත් කිරීම කෙරෙහි නිසි අවධානය යොමු කෙරේ.

සිය නීතිමය රාමුවට අනුකූලව, **සංචිත ගොඩ නැගීම සහ විනිමය අනුපාතිකයේ අධික විචලනය අවම කිරීම අරමුණු කරගත් මැදිහත්වීම් සමඟින් බාහිර කම්පනවලට එරෙහිව ස්වාරක්ෂකයක් ලෙස ක්‍රියා කිරීම** සඳහා වෙළඳපොළ විසින් තීරණය කෙරෙන සහ සහ නම්‍යශීලී විනිමය අනුපාතිකයක් පවත්වා ගැනීමට මහ බැංකුව කැපවී සිටියි. **වඩා පුළුල්, විනිවිදභාවයකින් යුතු සහ වඩා ද්‍රවශීලී විදේශ විනිමය වෙළඳපොළක් ප්‍රවර්ධනය කිරීම සඳහා සහ විනිමය අනුපාතික අවදානම් කළමනාකරණය සඳහා දේශීය විදේශ විනිමය වෙළඳපොළ සහභාගිවන්නන්ට හා පොදු ජනතාවට මඟ පෙන්වීම සඳහා නිරූපිත අනුපාතයක් ලෙස පදනම් එතැන් විදේශ විනිමය අනුපාතිකයක් (Benchmark Spot Exchange Rate) හඳුන්වා දීම ඇතුළු අවශ්‍ය ක්‍රමවේද වර්ධනය කිරීම සඳහා මහ බැංකුව අඛණ්ඩව කැපවේ**.

මහ බැංකුව විසින් 2023 වසරේ දී **ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (International Transactions Reporting System - ITRS)** සාර්ථකව ක්‍රියාත්මක කර ඇති අතර 2024 වසරේ ජනවාරි මාසයේ සිට ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතියේ දත්ත මත පදනම්ව සේවා වෙළඳාම පිළිබඳ මාසික සංඛ්‍යාලේඛන ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදී. මෙමගින් විදේශීය අංශයේ සංඛ්‍යාලේඛනවල නිරවද්‍යතාවය සහ එහි ආවරණය වැඩිදියුණු වන අතර එමගින් රටේ විභවයන් උපයෝගී කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයට පහසුකම් සැලසේ. ගෙවුම්

තුලනයෙහි මූලාශ්‍ර ගිණුමේ දත්තවල ගුණාත්මක භාවය සහ එහි ආවරණය වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය භාවිත කිරීමට මහ බැංකුව සැලසුම් කර ඇති අතර එමගින් විදේශ විනිමය ප්‍රවාහයන්ට අදාළ ප්‍රතිපත්ති විශ්ලේෂණය සහ සැලසුම් සකස් කිරීම සඳහා පහසුකම් සැලසෙනු ඇත.

## 3. මූල්‍ය පද්ධති ස්ථායීතාවය අරමුණු කරගත් ප්‍රතිපත්ති

*සාරාංශය*

- *සියලුම බැංකු ඊට අදාළ අවම ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ අනුකූල වන බව සහතික කිරීම සඳහා බැංකු ප්‍රාග්ධනීකරණ උපාය මාර්ගය පිළිබඳ නියාමන අධීක්ෂණය සිදු කිරීම*
- *බැංකු ආයතනවලට ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සහිතව ශක්තිමත් සහ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාවක් පවතින බව සහතික කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු සඳහා වෙළඳපොළ මත පදනම් වූ ඒකාබද්ධ කිරීමේ රාමුවක් ස්ථාපිත කිරීම*
- *බැංකු (සංශෝධන) පනත යටතේ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම*
- *අක්වෙරළ බැංකු ව්‍යාපාර පවත්වාගෙන යාමට පහසුකම් සැලසීම සඳහා කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය කිරීම*
- *මුදල් සමාගම් ඒකාබද්ධ කිරීම සඳහා වන වැඩපිළිවෙළෙහි II වන අදියර ක්‍රියාත්මක කිරීම*
- *මුදල් ව්‍යාපාර පනත සහ කල්බදු මූල්‍යකරණ පනත වෙත සංශෝධන හඳුන්වා දීම*
- *දේශීය පද්ධතිමය වශයෙන් වැදගත් බැංකු සඳහා අදාළ ප්‍රාග්ධන ස්වාරක්ෂක ප්‍රකාශයට පත්කිරීම සහ පද්ධතිමය වශයෙන් වැදගත් මුදල් සමාගම් හඳුනා ගැනීම*
- *තිරසාර මූල්‍ය පිළිබඳ ශ්‍රී ලාංකීය පෙර දැක්ම - 2.0 නිකුත් කිරීම*
- *සුදුසු සාර්ව විචක්ෂණ උපකරණ භාවිතය තුළින් බැංකු අංශයේ ණය අධීක්ෂණය ශක්තිමත් කිරීම*
- *අනුබද්ධ නීති කිහිපයක් සමඟ ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සංශෝධනය කිරීම*
- *රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව ක්‍රියාත්මක කිරීම*
- *මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසි හා අනුකූලව වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණය පුළුල් කිරීම*
- *පාරිභෝගිකයන්ට දැනුම්වත් තීරණ ගැනීමට හැකි වන පරිදි ප්‍රධාන මූල්‍ය තොරතුරු ප්‍රකාශයට පත් කිරීම*

### 3.1. බැංකු අංශයේ ප්‍රතිපත්ති

මූල්‍ය පද්ධති ස්ථායීතාව සහ බැංකු අංශයේ මෙහෙයුම් ශක්තිමත්භාවය සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව, කෙටි කාලයේ සිට මැදි කාලය දක්වා විහිදී යන ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මාලාවක් ක්‍රියාත්මක කිරීමට මහ බැංකුව අපේක්ෂා කරයි. විශාල දේශීය බැංකු නවයක් සඳහා වන ප්‍රතිව්‍යුහගත සහ ප්‍රතිප්‍රාග්ධනීකරණය සඳහා වන පෙර දැක්මට අනුකූලව, ප්‍රමාණවත් පරිදි ප්‍රාග්ධනීකරණය වූ බැංකු පද්ධතියක් තුළින් මූල්‍ය පද්ධති ස්ථායීතාව ශක්තිමත් කිරීම සඳහා **මහ බැංකුව විසින් බැංකු ප්‍රාග්ධනීකරණ උපාය මාර්ගය සකස් කර ඇත.** මෙම උපාය මාර්ගය යටතේ, සිය අධ්‍යක්ෂ මණ්ඩල විසින් අනුමත කරන ලද ප්‍රතිප්‍රාග්ධනීකරණ සැලසුම් බැංකු විසින් ඉදිරිපත් කර ඇති අතර, මෙම සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය, **සියලුම බැංකු සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතා සමඟ අනුකූල වන බව තහවුරු කිරීමට දැනට ක්‍රියාත්මක වන අධීක්ෂණය** සමඟ, අර්ධ වාර්ෂික ව

අධීක්ෂණය කෙරෙනු ඇත. තවද, මූල්‍ය පද්ධතිය ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් සහිත ශක්තිමත් සහ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ඇති බැංකුවලින් සමන්විත වන බව තහවුරු කිරීම සඳහා **බලපත්‍රලාභී බැංකු සඳහා වෙළඳපොළ මත පදනම් වූ ඒකාබද්ධ කිරීමේ රාමුවක් ස්ථාපිත කිරීමට** නියමිත අතර, මෙම ඒකාබද්ධකරණය අවශ්‍යතාවය අනුව සුදුසු පරිදි සිදු කිරීම සඳහා පහසුකම් සැලසීමට අපේක්ෂා කෙරේ.

විශාල නිරාවරණයන්, ආයතනික යහපාලනය, ද්‍රවශීලතා අනුපාත, සම්බන්ධිත පාර්ශ්ව හා කෙරෙන ගනුදෙනු සහ අක්වෙරළ බැංකු ව්‍යාපාර වැනි අංශ ආවරණය කරමින් **බැංකු (සංශෝධන) පනත** යටතේ නිකුත් කරන ලද විධාන ක්‍රියාත්මක කිරීම 2025 වසරේ දී අධීක්ෂණයට ලක් කෙරෙනු ඇත. නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා දැනට පවතින රෙගුලාසි ද **වෙළඳපොළ ප්‍රවණතා සහ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ඉහළම භාවිතයන්ට** අනුකූලව සමාලෝචනය කෙරෙනු ඇත.

මහ බැංකුව කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය වෙමින් අවශ්‍ය නියාමන සහ අධීක්ෂණ කටයුතු හරහා **අක්වෙරළ බැංකු ව්‍යාපාර පවත්වාගෙන යාමට පහසුකම් සලසනු ලැබේ.**

තවද, **වැඩිදියුණු වූ අර්බුද කළමනාකරණ සහ නිරාකරණ ක්‍රියාමාර්ග** ඔස්සේ ද මූල්‍ය පද්ධතියේ කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කෙරෙනු ඇත. මහ බැංකුව මූල්‍ය අංශ අර්බුද කළමනාකරණ කමිටුවේ ක්‍රියාකාරීත්වය සම්බන්ධීකරණය කිරීම සහ ඊට සහාය ලබා දීම සඳහා අඛණ්ඩව ක්‍රියා කරනු ඇත. අවදානම පදනම් කරගත් අධීක්ෂණයේ ඵලදායීත්වය, අධීක්ෂණමය යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම මගින් ඉහළ නංවනු ඇති අතර බැංකුවල අඛණ්ඩ අධීක්ෂණය ද තීව්‍ර කරනු ඇත.

මහ බැංකුව, මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත සහ මූල්‍ය කාර්ය සාධක බලකායෙහි නිර්දේශවලට අනුකූල ව, බැංකුවල අවදානම පදනම් කරගත් **මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ සුපරීක්ෂණ ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.**

### 3.2. බැංකු නොවන මූල්‍ය ආයතන අංශයෙහි ප්‍රතිපත්ති

2020 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද, **මුදල් සමාගම් ඒකාබද්ධ කිරීම සඳහා වන ප්‍රධාන සැලැස්ම ක්‍රියාත්මක කිරීම** සමඟ **නියාමන රාමුව ශක්තිමත් කරමින්** බැංකු නොවන මූල්‍ය ආයතන අංශය සුරක්ෂිත කිරීමට මහ බැංකුව කැපවී සිටී. ශක්තිමත් සහ ස්ථාවර බැංකු නොවන මූල්‍ය ආයතන අංශයක් නිර්මාණය කිරීම ඒකාබද්ධකරණ වැඩපිළිවෙලෙහි අරමුණ වන අතර, එය අදියර දෙකකින් සමන්විත වේ. **අදියර I යටතේ, ඒකාබද්ධ කිරීමේ ගනුදෙනු අටක් සාර්ථකව නිම කරන ලදී.**

**ඒකාබද්ධකරණ වැඩපිළිවෙළෙහි සංශෝධිත II වන අදියර**, 2025 මාර්තු සිට 2028 මාර්තු දක්වා තෙවසරක කාලයක් තුළ ක්‍රියාත්මක වන පරිදි, 2024 දෙසැම්බර් මාසයේ දී නිවේදනය කරන ලදී.

**මෙම ඒකාබද්ධකරණ වැඩපිළිවෙළෙහි II වන අදියර යටතේ ස්වාධීනව පවත්වා ගෙන යාමට අදහස් කරන මුදල් සමාගම්වල ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීමට අවධානය** යොමු කරන අතර II වන අදියර සාර්ථක ව ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා ඒ යටතේ ස්ථාපිත මිණුම් සපුරාලීම සම්බන්ධව මෙම මුදල් සමාගම්වල ප්‍රගතිය අධීක්ෂණය කරනු ලැබේ.

බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ නියාමනය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීමට, අවදානම් කළමනාකරණය වැඩිදියුණු කිරීමට සහ ස්ථායීතාවය ප්‍රවර්ධනය කිරීම සඳහා, එම අංශයේ ප්‍රවණතාවන්ට අනුකූල ව, **2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත සහ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත** සංශෝධනය කෙරෙනු ඇත. නියාමන රාමුව පුළුල් කිරීමට සහ එමගින් අවදානම් කළමනාකරණය හා මෙම අංශයේ ස්ථායීතාවය වැඩිදියුණු කිරීම සඳහා නීති සහ රෙගුලාසි නිකුත් කිරීමට නියමිතය. මීට අමතරව, මුදල් සමාගම්වල ක්‍රියාකාරීත්වය පිළිබඳ දැනුම්වත් කිරීම සඳහා මහජනතාව වෙත සිදු කරන හෙළිදරව් කිරීම් පුළුල් කරන අතරම, අධීක්ෂණ ක්‍රියාවලියේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා ස්වයංක්‍රීයකරණය භාවිත කරනු ඇත.

### 3.3. සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති

මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීම සඳහා වන පියවරක් ලෙස සාර්ව විචක්ෂණ ප්‍රවේශය පිළිබඳ සන්නිවේදනය වැඩිදියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස, මහ බැංකුව සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති රාමුව ප්‍රකාශයට පත් කළේය.

මහ බැංකුව පද්ධතිමය අවදානම් ආවේක්ෂණය වැඩිදියුණු කරමින් ස්වකීය සාර්ව විචක්ෂණ ප්‍රවේශය ශක්තිමත් කරනු ලබයි. මේ සම්බන්ධයෙන් සලකා බැලීමේ දී, විවිධ සාර්ව-මූල්‍ය ආතති අවස්ථාවන් සඳහා සංවේදීතාව වඩා හොඳින් තක්සේරු කිරීමට ආතති පරීක්ෂණ සහ විශ්ලේෂණ රාමු වැඩිදියුණු කරන ලද අතර, එමගින් මූල්‍ය පද්ධතියේ වර්ධනයන් සහ අවදානම් අධීක්ෂණය කිරීම ශක්තිමත් කරන ලදී. **2025 වසරේ දී මුදල් සමාගම් අංශය සඳහා ද සිය ආතති පරීක්ෂණ රාමු හඳුන්වා දීමට මහ බැංකුව අපේක්ෂා කරයි.**

තවද, **පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු සහ ඒවාට අදාළ ප්‍රාග්ධන ස්වාරක්ෂක නැවත තක්සේරු කිරීම** සිදු කර ඇත. පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු ඒවාට අදාළ ප්‍රාග්ධන ස්වාරක්ෂක සමඟ ප්‍රකාශයට පත් කිරීම 2025 වසරේ දී සිදු කිරීමට අපේක්ෂා කෙරේ. ඉදිරියේ දී මහ බැංකුව මූල්‍ය අංශයේ ශක්තිමත්භාවය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා **පද්ධතිමය වශයෙන් වැදගත් මුදල් සමාගම් ද හඳුනා ගැනීම** කෙරෙහි අවධානය යොමු කරනු ඇත.

සුදුසු සාර්ව විචක්ෂණ උපකරණ භාවිතය තුළින් වූ ඉලක්කගත ප්‍රතිපත්ති ප්‍රවේශයක් මගින් බැංකු අංශයේ ණය අධීක්ෂණය වැඩිදියුණු කරනු ඇත. මෙමගින් ණය ලබා දෙන ආයතන අතර අවදානම් කළමනාකරණය වැඩිදියුණු කරන අතර මූල්‍ය පද්ධති ස්ථායීතාවය සහතික කරනු ඇත.

මහ බැංකුව විසින් රටේ සාර්ව විචක්ෂණ අධිකාරිය ලෙස, මූල්‍ය අංශයේ සියලුම නියාමන ආයතන එක්ව කටයුතු කරන **මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව (FSOC) හරහා මහ බැංකුවේ නියාමන විෂය පථයෙන් පරිබාහිර මූල්‍ය අංශයේ සහභාගීවන්නන් වෙත සිය සාර්ව විචක්ෂණ ප්‍රවේශය පුළුල් කරයි.**

මූල්‍ය ස්ථාවරත්වය සහතික කිරීම සඳහා මහ බැංකුව පුළුල් පරාසයක ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, මූල්‍ය පද්ධතියේ බහුවිධ අංශ ආවරණය වන පරිදි තවදුරටත් ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙමින් පවතී. ආර්ථිකය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීම සහ ණය චක්‍රය ප්‍රසාරණාත්මක අදියරකට පැමිණීමත් සමඟ, අවදානම් ගැනීමේ ප්‍රවණතාව ඉහළ යා හැකිය. මේ අනුව, මහ බැංකුව විසින් පද්ධතිමය අවදානම් මනාව අධීක්ෂණය කරන අතර මතුවන ඕනෑම අවදානමක් පාලනය කිරීම සඳහා සහ එමගින් අඛණ්ඩ මූල්‍ය පද්ධති ස්ථායීතාව සහතික කිරීමට සුදුසු සාර්ව විචක්ෂණ සහ ක්ෂුද්‍ර විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කරනු ඇත.

## 3.4. තිරසාර මූල්‍ය යටතේ වන මුලපිරීම්

වැදගත් මුලපිරීමක් ලෙස, **තිරසාර මූල්‍ය පිළිබඳ ශ්‍රී ලාංකීය පෙර දැක්ම - 2.0** ක්‍රමයෙන් විකාශය වන ගෝලීය සහ දේශීය තත්ත්වයන්ට අනුකූලව, 2025 වසරේ දී නිකුත් කිරීමට නියමිතව ඇති අතර රටෙහි තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් පුළුල් කිරීම සඳහා කාලෝචිත මාර්ගෝපදේශයක් සැපයීමේ අරමුණින් ක්‍රියාත්මක කෙරෙනු ඇත. පෙර දැක්ම ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා, එම පෙර දැක්මට අනුකූලව තිරසාර භාවිතයන් ඒකාබද්ධ කිරීමට අවශ්‍ය දැනුම සහ උපකරණ පාර්ශ්වකරුවන්ට ලබා දීමට, **ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය** පිළිබඳ වැඩසටහන් ඇතුළු **ධාරිතා ගොඩනැගීමේ ක්‍රියාකාරකම්** මහ බැංකුව විසින් අඛණ්ඩව පවත්වා ගෙන යනු ඇත. තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා පවතින නියාමන රාමුව යාවත්කාලීන කරන ලද බාසල් මූලික මූලධර්ම මත පදනම්ව සමාලෝචනය කරනු ලබන අතර හඳුනාගත් අඩුපාඩු සපුරා ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

## 3.5. ගෙවීම් සහ පියවීම් පද්ධති

ස්ථාවර සහ කාර්යක්ෂම ගෙවීම් පද්ධතියක් පවත්වාගෙන යෑම ශක්තිමත් මූල්‍ය පද්ධතියක් සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. **මේ සම්බන්ධයෙන්, අදාළ නීති පද්ධතිය හා ගෙවීම් පද්ධති වැඩිදියුණු කිරීම සහ ඩිජිටල් ගෙවීම් පිළිබඳ මහජන විශ්වාසය වැඩි කිරීම සඳහා අවශ්‍ය මුලපිරීම් සැලසුම් කර ඇත.** ඩිජිටල් ගෙවීම් ශීඝ්‍රයෙන් වර්ධනය වන නිසා, ගෙවීම් ක්ෂේත්‍රයේ නෛතික සහ ආයතනික ව්‍යුහය වැඩිදියුණු කිරීම සඳහා මහ බැංකුව තෙවසරක පුළුල් සැලැස්මක් ආරම්භ කර ඇත. මෙම සැලැස්ම ආරම්භ වන්නේ ගෙවීම් සහ පියවීම් පද්ධතිවල ආවේක්ෂණය, අධීක්ෂණය සහ නියාමනය සඳහා ඇති නීතිමය රාමුව වැඩිදියුණු කිරීමෙන් මෙන්ම ගෙවීම් නවෝත්පාදන සහ ශ්‍රී ලංකාවේ ඩිජිටල් ගෙවීම් වෙළඳපොළ සංවර්ධනය කිරීම සඳහා පහසුකම් සැලසීමෙනි. ඒ අනුව, මහ බැංකුව **ගෙවීම් සහ බේරුම් කිරීමේ පද්ධති පනත සංශෝධනය කිරීමේ** ක්‍රියාවලියක නිරතව සිටියි. සුළු

පරිමාණ ඩිජිටල් ගෙවීම් වේගයෙන් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා, ගෙවීම් පහසුකම් ලබා දෙන ජංගම යෙදුම්වලට අදාළ අවම අනුකූලතා ප්‍රමිතීන් සඳහා වූ මාර්ගෝපදේශ වැනි අනුබද්ධ නීති කිහිපයක් 2025 වසරේ දී සංශෝධනය කරනු ඇත.

**දේශීය ගෙවීම් ගනුදෙනු සඳහා ISO 20022 ප්‍රමිතීන්ට සම්පූර්ණයෙන්ම අනුකූල වන පරිදි 2024 වසරේ දී නව තත්කාලීන දළ පියවීම් (RTGS) පද්ධතියක්** මහ බැංකුව විසින් ආරම්භ කරන ලදී. **අන්තර්ජාතික කාලරාමුවලට අනුගත වෙමින් සියලු ජාත්‍යන්තර ගනුදෙනු සඳහා මෙම ප්‍රමිතියට අනුකූල වීමට මහ බැංකුව සැලසුම් කරයි.**

රාජ්‍ය ආයතන සඳහා සිදු කරන ගෙවීම් විශේෂයෙන් ඉලක්ක කරමින්, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය (Common Electronic Fund Transfer Switch – CEFTS) භාවිතයෙන් සිදු කරන ගෙවීම් ක්‍රම තවදුරටත් පුළුල් කෙරේ. ඩිජිටල්කරණය වූ දත්ත ගබඩාවන් (Database) නොමැති රාජ්‍ය ආයතනවලට අන්තර්ජාල බැංකුකරණය/ජංගම ගෙවීම් යෙදුම් හරහා මහජනතාවගෙන් තත්කාලීන ගෙවීම් ලබා ගැනීමට සහාය වන **රජයේ ඩිජිටල් ගෙවීම් වේදිකාව (Government Digital Payment Platform - GDPP)**, 2024 වසරේ දී සිදු කරන ලද සාර්ථක නියමු පරීක්ෂණවලින් පසුව 2025 වසරේ දී ක්‍රියාත්මක වනු ඇත.

තවද, **අන්තර් බැංකු ගෙවීම් පද්ධති වෙත සාමාජිකයන් සම්බන්ධ කරවීමේ ක්‍රියාපටිපාටිය මෙන්ම ගෙවීම් සේවා සඳහා බලපත්‍ර ලබාදීමේ ක්‍රියාපටිපාටිය සමාලෝචනය කිරීමට** මහ බැංකුව අපේක්ෂා කරයි. **2025 වසරේ ජනවාරි මාසයේ සිට, LANKAQR සඳහා වෙළඳ වට්ටම් අනුපාතය (Merchant Discount Rate - MDR) 0.5% සිට 1%ක් දක්වා ප්‍රතිස්ථාපනය කරනු ලබන** අතර, එමගින් මූල්‍ය ආයතන සහ මූල්‍ය තාක්ෂණ ආයතන (FinTechs) LANKAQR සක්‍රීයව ප්‍රවර්ධනය කිරීමට දිරිමත් කරයි.

එපමණක් නොව, ඩිජිටල් ගෙවීම් ආශ්‍රිතව මහජනතාවට ඇති ගැටලු හඳුනා ගනිමින්, **වංචා සිදු වන ආකාරය නිරීක්ෂණය කිරීම සහ අවශ්‍ය මාර්ගෝපදේශ නිකුත් කිරීම මගින් මහජන විශ්වාසය සුරක්ෂිත කිරීමට** මහ බැංකුව කැපවී සිටියි. මෙහි අදියරයක් ලෙස, **ගෙවීම් යෙදුම් හරහා ගනුදෙනුකරුවන්ගේ ජංගම සහ ඉතුරුම් ගිණුම් වෙත අනවසරයෙන් සිදුකරන ප්‍රවේශවීම්වලින් ආරක්ෂා කිරීම සඳහා මහ බැංකුව විසින් 2025 වසරේ මාර්තු මස සිට ක්‍රියාත්මක වන පරිදි 2024 වසරේ දී චක්‍රලේඛයක් නිකුත් කරන ලදී.** මෙය දැනට පවතින ගෙවීම් යෙදුම්හි ආරක්ෂාව සම්බන්ධ නියෝගයන්ට අමතරව නිකුත් කළ චක්‍රලේඛයකි. ඩිජිටල් ගෙවීම් භාවිතයේ ඇති විෂමතාවන්ට විසඳුම් වශයෙන් මහ බැංකුව විසින් ඩිජිටල් ගෙවීම් සේවා, ඒවායේ ප්‍රතිලාභ, ඒ ආශ්‍රිත ආරක්ෂක ක්‍රමවේද සහ, වංචා සහ කූටෝපක්‍රම වැනි විය හැකි අවදානම් පිළිබඳව රටම **ආවරණය වන මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්** ජනමාධ්‍ය ඔස්සේ දීපව්‍යාප්තව පවත්වනු ඇත.

### 3.6. මූල්‍ය පාරිභෝගික සබඳතා වැඩිදියුණු කිරීම

වඩාත් විනිවිදභාවයකින් යුතු සහ පාරිභෝගික කේන්ද්‍රීය තිරසාර මූල්‍ය පද්ධතියක් ප්‍රවර්ධනය කිරීම මහ බැංකුවේ අරමුණ වන බැවින් මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය ශක්තිමත් කිරීම එහි ප්‍රධාන ප්‍රමුඛතාවයකි. ඒ හා අදාළව, මූල්‍ය පද්ධතිය කෙරෙහි මූල්‍ය පාරිභෝගිකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීම සඳහා 2025 වසරේ දී සහ ඉන් ඔබ්බට උපාය මාර්ගික මුලපිරීම් මාලාවක් සැලසුම් කර ඇත.

වෙළඳපොළ හැසිරීම පිළිබඳ එතැන් පරීක්ෂණයේ වාර ගණන සහ පරාසය වැඩි කිරීම මගින් **වෙළඳපොළ හැසිරීම් අධීක්ෂණයේ විෂය පථය පුළුල් කිරීමට** අපේක්ෂා කෙරේ. මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රෙගුලාසිවලට වඩාත් අනුකූල වීම සහතික කිරීම සහ නැගී එන මූල්‍ය පාරිභෝගික අවදානම් සඳහා පිළියම් යෙදීම මෙහි අරමුණයි.

**තීරණාත්මක මූල්‍ය පාරිභෝගික අවදානම් හා අතෘප්තිය සඳහා පිළියම් යෙදීම සහ අසාධාරණ භාවිතයන් වැළැක්වීම හා අනුකූලතාවය සහතික කිරීමට** පැහැදිලි මාර්ගෝපදේශ සැකසීම සඳහා, ගාස්තු, දඩ මුදල් හා අනාගත වගකීම් සඳහා පොලී පැනවීම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් විධානයන් නිකුත් කිරීමට නියමිතය.

විනිවිදභාවය වැඩිදියුණු කිරීමේ උත්සාහයක් ලෙස, පාරිභෝගිකයින්ට දැනුම්වත් ලෙස තීරණ ගැනීමට හැකි වන පරිදි, සියලුම මූල්‍ය සේවා සපයන්නන්ගේ පොලී අනුපාත සහ ගාස්තු වැනි **ප්‍රධාන මූල්‍ය තොරතුරු** මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීමට සැලසුම් කර ඇත.

## 4. මහ බැංකුවේ අනෙකුත් ප්‍රතිපත්ති සහ කාර්යයන්

*සාරාංශය*

- අදාළ ප්‍රතිපත්ති රාමු පුළුල් කිරීම හරහා මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රවර්ධනය සඳහා ගනු ලබන ප්‍රයත්න
- රාජ්‍ය ණය කළමනාකරණ කාර්යය, රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය වෙත ක්‍රමානුකූලව පැවරීම සඳහා පහසුකම් සැලසීම
- වෙළඳපොළෙහි වෙනස් වන අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් දැනට පවත්නා විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ සවිස්තරාත්මක සමාලෝචනයක් සිදු කිරීම
- මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව සහ රෙගුලාසි ශක්තිමත් කිරීම
- ඩිජිටල්කරණය ඔස්සේ සේවක අර්ථසාධක අරමුදලෙහි මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම
- සාමාජිකයින් සඳහා ආරක්ෂිත සහ ස්ථාවර විශ්‍රාම ප්‍රතිලාභ ලබා දීම සඳහා සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජන විවිධාංගීකරණය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවට මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීමේ වගකීම පැවරී ඇත. තවද, මහ බැංකුව රජය වෙනුවෙන් නියෝජිත කාර්යයන් කිහිපයක් ඉටු කරයි. ඉදිරි කාලසීමාව තුළ දී මෙම ක්ෂේත්‍රවල ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රධාන ප්‍රතිපත්ති කිහිපයක් මෙම කොටසෙහි සාරාංශ කොට දක්වා ඇත.

### 4.1. මූල්‍ය අන්තර්ගතභාවය

මහ බැංකු පනත බලාත්මක කිරීමත් සමඟ, මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන කාර්යභාරයේ මූලික අවධානය මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම දක්වා වෙනස් වී ඇත. මෙම වෙනස, වඩාත් අන්තර්ගත හා තිරසාර මූල්‍ය පද්ධතියක් ස්ථාපිත කිරීමේ වැදගත්කම පිළිබඳ පවතින පුළුල් අවධානය සංකේතවත් කරයි.

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ (NFIS) අදියර I යටතේ 2021 වසරේ සිට 2024 වසර දක්වා ක්‍රියාත්මක කළ මූල්‍ය අන්තර්ගතභාවය වැඩිදියුණු කිරීමේ උපාය මාර්ග සහ රෙගුලාසිවල සමස්ත ප්‍රගතිය සම්බන්ධයෙන් පශ්චාත් විශ්ලේෂණයක් 2025 වසරේ මුල් භාගයේ දී සිදු කිරීමට නියමිතය. ඉන් අනතුරුව, **ජාතික මට්ටමේ මූල්‍ය අන්තර්ගතභාවයෙහි ඉල්ලුම් පැතිකඩ පිළිබඳ සමීක්ෂණයක්** සිදු කෙරෙනු ඇත. **2025 වසරේ දී, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික**

**උපාය මාර්ගයෙහි දෙවන අදියර සකස් කිරීමට ද අපේක්ෂිතය.** මෙම නව අදියර මගින්, රටේ විෂමානුකූල ලෙස මූල්‍ය පද්ධතියෙන් බැහැර වී තිබෙන ජන කොටස් සඳහා විධිමත් මූල්‍ය සේවා භාවිතය සහ එම සේවාවල ගුණාත්මකභාවය පුළුල් කිරීම සඳහා විශේෂිත මැදිහත්වීම් සිදු කිරීම පිළිබඳව සලකා බලනු ඇත. තවද, පවතින මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ප්‍රතිපත්ති රාමුව පුළුල් කිරීමට, **මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි අංගයක් ලෙස හරිත මූල්‍ය අන්තර්ගතභාවය (IGF) එක් කිරීමට සහ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සහ වෙළඳපොළ හැසිරීම අධීක්ෂණය තුළ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ අංගය පුළුල් කිරීමට** මහ බැංකුව අපේක්ෂා කරයි.

## 4.2. රාජ්‍ය ණය කළමනාකරණය

රාජ්‍ය ණය කළමනාකරණය, මහ බැංකුවේ ආරම්භයේ සිටම මහ බැංකුව විසින් ඉටු කරනු ලබන ප්‍රධාන නියෝජිතායතන කාර්යයන්ගෙන් එකකි. වසර 75කට ආසන්න කාලයක් මහ බැංකුව විසින් මෙම වගකීම දැරීමෙන් පසුව, 2024 වසරේ දී රාජ්‍ය ණය කළමනාකරණ පනත බලාත්මක කිරීම මගින් මුදල් අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ණය පිළිබඳ සියලු අංශ කළමනාකරණය කිරීම සඳහාම වෙන් වූ කාර්යාලයක් නිර්මාණය කරන ලදී. මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සහ රාජ්‍ය ණය කළමනාකරණය එකම ආයතනයක් මගින් සිදු කිරීමේ දී පැන නගින අභිලාෂ අතර ගැටුම් පිළිබඳ දිගුකාලීන ගැටලුව තුරන් කිරීමට එමගින් හැකි වනු ඇත. **රාජ්‍ය ණය කළමනාකරණ කාර්යය, ඒ සඳහාම පිහිටුවන ලද රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය නමින් හැඳින්වෙන ආයතනය වෙත පැවරීම සඳහා මහ බැංකුව විසින් පහසුකම් සපයනු ඇත.** රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය, මේ වසර අවසන් වන විට ක්‍රියාත්මක වීමට අපේක්ෂිතය.

## 4.3. විදේශ විනිමය කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව රජය වෙනුවෙන් විදේශ විනිමය කළමනාකරණ කාර්යය සිදු කරනු ලබයි. දේශීය විදේශ විනිමය වෙළඳපොළ ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමෙන් පසුව, **විදේශ විනිමය පනත යටතේ නිකුත් කර ඇති දැනට පවතින රෙගුලාසි, නියෝග සහ විධාන නැවත තක්සේරු කිරීම සඳහා පරිපූර්ණ සහ සවිස්තරාත්මක සමාලෝචනයක් ආරම්භ කෙරෙනු ඇත.** දේශීය විදේශ විනිමය වෙළඳපොළ තුළ වෙනස් වන ප්‍රවණතා ඇගයීම, පාර්ශ්වකරුවන්ගේ වෙනස්වන අවශ්‍යතා සහ ගැටලු සම්බන්ධව කටයුතු කිරීම, සහ සමස්ත නියාමන රාමුව වැඩිදියුණු කිරීම මෙම සමාලෝචනයේ අරමුණ වේ. 2022 වසරේ දී හඳුන්වා දුන් අපනයන ආදායම් අධීක්ෂණ පද්ධතිය, අධීක්ෂණ කටයුතුවල දී සහ අනුකූල නොවීම්වලට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමේ දී වැඩි කාර්යක්ෂමතාවයක් සහ ඵලදායීතාවයක් සහිත වීම සහතික කිරීම සඳහා තවදුරටත් සංවර්ධනය කෙරේ. මෙම වැඩිදියුණු කිරීම් ඉහළ විනිවිදභාවයක් ඇති කිරීමට සහ රටේ විදේශ විනිමය සංචිතවල සමස්ත ස්ථාවරත්වයට දායක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, **මුදල් හුවමාරු කිරීමේ**

**ව්‍යාපාර ක්ෂේත්‍රය මූල්‍ය සේවාවන්හි විශ්වසනීය ක්ෂේත්‍රයක් බවට පරිවර්තනය කිරීම සඳහා එම ව්‍යාපාර ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීමට අපේක්ෂා කෙරේ.**

## 4.4. මූල්‍ය බුද්ධි ඒකකය

**මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායම (APG) විසින් සම්බන්ධීකරණය කරනු ලබන ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ රාමුව පිළිබඳ තුන් වන අන්‍යොන්‍ය ඇගයීම, 2026 වසරේ මාර්තු මාසයේ දී ආරම්භ කිරීමට නියමිතය.** මෙම ඇගයීම මගින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමට එරෙහිව කටයුතු කිරීමට ශ්‍රී ලංකාව විසින් දරන ප්‍රයත්නයන් තක්සේරු කෙරෙනු ඇත. මෙහි දී මූල්‍ය කාර්යසාධක බලකායේ (FATF) නිර්දේශ හතළිහට තාක්ෂණිකව අනුකූල වන බවට සහ ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ මෙරට පවතින රාමුව මූල්‍ය කාර්ය සාධක බලකායේ ආසන්න ප්‍රතිඵල (Immediate Outcomes) 11 යටතේ ඵලදායී ලෙස ක්‍රියාත්මක වන බවට ශ්‍රී ලංකාව විසින් සහතික කළ යුතුය.

2024 වසරේ දෙසැම්බර් මස ප්‍රතිස්ථාපනය කරන ලද ඉහළ මට්ටමේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ කාර්යසාධක බලකාය 2027 වසරේ ජූලි මාසයේ දී අන්‍යොන්‍ය ඇගයීම සාර්ථකව නිමවන තුරු ක්‍රියාත්මක වනු ඇත. මූල්‍ය කාර්යසාධක බලකාය මගින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳව 2021/2022 වසරවල දී සිදු කරන ලද ජාතික අවදානම ඇගයීම සහ මීට පෙර 2014/2015 වසර සඳහා සිදුකරන ලද අන්‍යොන්‍ය ඇගයීම මගින් හඳුනාගනු ලැබූ නිර්ණායක සහ දුර්වලතා මත පදනම්ව සකස් කරන ලද, විවිධ ආයතන සඳහා විශේෂිත වූ ක්‍රියාකාරී සැලසුම් 24ක් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කර ඇත. එම සැලසුම් දැනට අදාළ පාර්ශ්වකරුවන් වන අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන විසින් ක්‍රියාත්මක කරමින් පවතින අතර, එහි ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ කාර්ය සාධක බලකාය විසින් අඛණ්ඩව සමාලෝචනය කරනු ලැබේ.

**මූල්‍ය බුද්ධි ඒකකය එහි පාර්ශ්වකරුවන් සහ ක්‍රියාකාරී කණ්ඩායම් සමඟ එක්ව 2025 වසරේ දෙවන කාර්තුව තුළ ජාතික අවදානම ඇගයීම තවදුරටත් යාවත්කාලීන කිරීමක් සිදු කිරීමට අපේක්ෂා කරයි.** මෙම ඇගයීම තුළ 2021/2022 වසර සඳහා ජාතික අවදානම ඇගයීම යාවත්කාලීන කිරීමට අමතරව නව ක්ෂේත්‍ර ලෙස, බදු සම්බන්ධ අපරාධ සහ සමූල ඝාතක අවි ව්‍යාප්තිය මූල්‍යනය සම්බන්ධ අවදානම් පිළිබඳ ඇගයීමක් ද ඇතුළත් වේ. මූල්‍ය බුද්ධි ඒකකය සමඟ මූල්‍ය නොවන ආයතන අතර සහ ඒවායේ නියාමන අධිකාරීන් අතර සහයෝගීතාව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය බුද්ධි

ඒකකය විසින් ක්‍රියාකාරී කණ්ඩායම් කිහිපයක් පිහිටුවීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව, මූල්‍ය බුද්ධි ඒකකය, නියාමන ආයතන, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්, පෞද්ගලික අංශයේ අදාළ ආයතන, විවිධ අංශ සඳහා විශේෂිත වූ සංගම් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් ඇතුළුව ක්‍රියාකාරී කණ්ඩායම් ද පිහිටුවීමට සැලසුම් කර ඇත.

මීට අමතරව, ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව නීතිමය රාමුව ශක්තිමත් කිරීමට, **මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ප්‍රධාන නීති පනත් තුන සඳහා සංශෝධන කෙටුම්පත් කිරීමේ අවසන් අදියරේ කටයුතුවල ද මූල්‍ය බුද්ධි ඒකකය නිරතව සිටී.** මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ ජාතික සම්බන්ධීකරණ කමිටුව විධිමත් කිරීම මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතෙහි සංශෝධන හරහා සිදුවනු ඇත. මෙම නීතිමය සංශෝධන 2025 වසරේ දෙවන කාර්තුව වන විට බලාත්මක කිරීමට අපේක්ෂා කෙරෙන අතර, ඒ සඳහා අදාළ රීති සහ රෙගුලාසි සමාලෝචනය, කෙටුම්පත් කිරීම සහ නිකුත් කිරීම 2025 වසරේ දෙවන කාර්තුව වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. තවද, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ප්‍රතිලාභී හිමිකාරීත්ව (Beneficial Ownership) අවශ්‍යතා සම්බන්ධව සමාගම් පනතට සංශෝධන ඉදිරිපත් කිරීමට සහාය වන අතර මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම හා සම්බන්ධ වෙනත් අදාළ නීතිමය සංශෝධන හෝ රෙගුලාසි සඳහා ද සහාය වනු ඇත.

දැනුම හුවමාරුව, ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම සහ ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල වීම වැඩිදියුණු කිරීම සඳහා, **දේශීයව සහ අදාළ විදේශීය පාර්ශ්ව සමඟ ද්විපාර්ශ්වික අවබෝධතා ගිවිසුම් අවශ්‍ය පරිදි වැඩි කිරීමට මූල්‍ය බුද්ධි ඒකකය අරමුණු කරයි.** මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ තීරණාත්මක වැදගත්කම පිළිබඳව පාර්ශ්වකරුවන් දැනුවත් කිරීම අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ඇත. මුදල් විශුද්ධිකරණය වැළැක්වීම/ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධ රාමු ශක්තිමත් කිරීම තුළින් මූල්‍ය පද්ධතියේ විශ්වසනීයත්වය වැඩිදියුණු වීම, විදේශ ආයෝජන වැඩි වීම, ජා. මූ. වෙළඳපොළ වෙත ප්‍රවේශය වැඩි කිරීම සහ යහපාලන පිළිවෙත් ප්‍රවර්ධනයට මනා සහායක් ලැබීම වැනි ආර්ථික, සාමාජයීය සහ ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් ප්‍රතිලාභ රැසක් රටට ලැබෙනු ඇත.

### 4.5. සේවක අර්ථසාධක අරමුදල කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල, රටේ විශාලතම විශ්‍රාමික අරමුදල වන අතර එහි වටිනාකම 2024 වසරේ දී රුපියල් ට්‍රිලියන හතර ඉක්මවා ඇත.

**සේවක අර්ථසාධක අරමුදල විසින් මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා වාර්තා ඩිජිටල්කරණය සහ සාමාජික දායක මුදල් මාර්ගගත ගෙවීම් හරහා සිදු කිරීමට ඉඩ ලබා දීම ඇතුළු විසඳුම් කිහිපයක් ක්‍රියාත්මක කරයි.** නිසැකවම, මාර්ගගත ගෙවීම් ක්‍රම හඳුන්වාදීම තුළින් සේවා යෝජකයින්ට ඔවුන්ගේ සේවක අර්ථසාධක දායක මුදල් ගෙවීමේ පහසුව සහ නම්‍යශීලීභාවය ලබා දෙනු ඇති අතර මෙමගින් ක්‍රියාවලිය තවදුරටත් විධිමත් කර පරිපාලනමය ගැටලු අඩු කරනු ඇත. නවීන විසඳුම් සමඟින් දායක මුදල් එකතු කිරීමේ ක්‍රියාවලිය ශක්තිමත් කරන අතරම සාමාජිකයින්ට විශ්‍රාම ගැනීමට පෙර සහ පසුව ප්‍රතිලාභ ලබාදීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත. **තවද, පවතින පද්ධති සහ ක්‍රියාවලිය නැවත වැඩිදියුණු කර සකස් කිරීම සඳහා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් නවීකරණය කිරීමට අපේක්ෂා කෙරේ.** මෙම පුළුල් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණික විසඳුම, ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලීන් සඳහා පහසුකම් සපයන අතර අරමුදල වඩාත් ඵලදායී ලෙස කළමනාකරණයට මගපාදනු ඇත.

සේවක අර්ථසාධක අරමුදල, සමස්ත අරමුදලේ ආරක්ෂාව සහතික කරන අතරම ඉහළ අවදානම්-ගැළපුම් ප්‍රතිලාභ අනුපාතයක් ලබාගැනීම සඳහා **එහි ආයෝජන විවිධාංගීකරණය කිරීමේ මාර්ග පිරික්සමින් සිටියි**. මෙම ක්‍රියාමාර්ග අනුගමනය කිරීම මගින්, සේවක අර්ථසාධක අරමුදල තම සාමාජිකයින් සඳහා ආරක්ෂිත සහ ස්ථාවර විශ්‍රාම ප්‍රතිලාභ ලබා දීම සඳහා වන කැපවීම පවත්වා ගැනීම අරමුණු කරයි.

## 4.6. මහ බැංකුවේ සන්නිවේදන උපාය මාර්ගය

මහ බැංකුව පිළිබඳ විශ්වසනීයත්වය ඉහළ නැංවීමෙහිලා අත්‍යවශ්‍ය වන, සිය ක්‍රියාකාරකම්වල විනිවිදභාවය සහ වගවීමේ වැදගත්කම පිළිබඳව මහ බැංකුව අවබෝධයෙන් සිටියි. 2025 වසර සඳහා වූ මහ බැංකුවේ සන්නිවේදන උපාය මාර්ගය මගින් මහජනතාවගේ අවබෝධය සහ විශ්වසනීයත්වය වර්ධනය කිරීම සඳහා දත්ත සහ තොරතුරු සඳහා ප්‍රවේශ වීම සහ ඒවා ලබාගැනීමේ හැකියාව ඉහළ නැංවීමට ප්‍රමුඛතාවය ලබා දෙනු ඇත. **ප්‍රතිපත්ති දැනුම්දීම් සෑම දෙනාටම ළඟා වන බවත් ඒවා නිවැරදිව අර්ථකථනය කර ඇති බවත් සහතික කිරීමට මහ බැංකුව අරමුණු කර ගනී.** සංඛ්‍යා දත්තවලට ප්‍රවේශ වීම සහ භාවිතය ඉහළ නැංවීම සඳහා දත්ත බෙදා හැරීම වැඩිදියුණු කිරීමට මහ බැංකුව පියවර ගනු ඇත.

මහජනතාවගේ අපේක්ෂා මනාව හඳුනාගනිමින් සහ වඩාත් දැනුම්වත් තීරණ ගැනීමට උපකාරී වන මහජනතාවගේ අදහස් දැන ගැනීම සඳහා මහ බැංකුව එහි පාර්ශ්වකරුවන් සමඟ සමීපව කටයුතු කරනු ඇත.

## 4.7. මහ බැංකුවේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම

රටේ ප්‍රගතිය සඳහා සිය කාර්යභාරය ඵලදායී ලෙස ඉටු කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව නිපුණතා වර්ධනය කළමනාකරණය කිරීම සඳහා මානව ප්‍රාග්ධන පරිපාලනය, විශේෂඥතා, හැකියා, විනය සහ යෝග්‍යතා ශක්තිමත් කිරීම සහ ආයතනගත කිරීම සඳහා කැපවී සිටී.

සම්පත් ප්‍රශස්ත ලෙස භාවිත කිරීම, කාර්යක්ෂම දත්ත කළමනාකරණය සහ වඩාත් හොඳ තීරණ ගැනීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ තාක්ෂණික හැකියාව ඉහළ නැංවීම සඳහා වැඩසටහන් රැසක් හඳුන්වා දීමට මෙන්ම ඉදිරි කාලය තුළ දී **සයිබර් ආරක්ෂණ (Cyber Security) අංශ කෙරෙහි ද වැඩි අවධානයක් යොමු කෙරෙනු ඇත.**

අවදානම් කළමනාකරණයේ මීළඟ උපායමාර්ගික සන්ධිස්ථානය ලෙස **මහ බැංකුව තුළ අවදානම් අභිරුචි රාමුවක් (Risk Appetite Framework)** ක්‍රියාත්මක කිරීමට ද පියවර ගෙන ඇත. මහ බැංකුව සිය දෛනික කටයුතු සඳහා **පරිසර හිතකාමී සහ තිරසාර පරිචයන් යොදා ගැනීමේ ක්‍රියාවලියක** ද නිරතව සිටී.

## 5. රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය

ස්ථාවර ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනය සහ මහ බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මහ බැංකුව සහ රජය අතර රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති පිළිබඳව ඵලදායී සම්බන්ධීකරණය අතිශයින් වැදගත් වේ. උද්ධමනය සැපයුම් අංශයේ සාධක සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල බලපෑමට නිරන්තරයෙන් ලක්වන බැවින්, මිල ස්ථායීතාව පවත්වා ගැනීමේ අරමුණු කරා ගමන් කිරීමේ දී නිසි ප්‍රතිපත්ති සම්බන්ධීකරණය අත්‍යවශ්‍ය වේ. මෙම සම්බන්ධීකරණය මූල්‍ය පද්ධති ස්ථායීතා අරමුණ ඉටුකර ගැනීමේ දී ද එලෙස ම වැදගත් වේ. රජයේ ප්‍රතිපත්ති මගින් මූල්‍ය අංශයට බලපෑම් ඇති කළ හැකි සේම, මූල්‍ය අංශය පිළිබඳ මහ බැංකුවේ ප්‍රතිපත්ති රජයේ කටයුතු කෙරෙහි ද බලපෑම් ඇති කරයි.

**මහ බැංකු පනත යටතේ පිහිටුවන ලද සම්බන්ධීකරණ සභාව මගින් රජය සහ මහ බැංකුව අතර රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සිදු කරනු ලැබේ.** සම්බන්ධීකරණ සභාව කාර්තුමය වශයෙන් රැස්වන අතර, එහි දී සාර්ව ආර්ථික සහ මූල්‍ය තත්ත්වයන් සහ ඉදිරි දැක්ම; සහ රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය ස්ථායීතා සම්බන්ධීකරණයට අදාළව පැවතිය හැකි ඌනතා පිළිබඳව දීර්ඝව සාකච්ඡා කෙරෙන අතර, උපාය මාර්ග සහ ඕනෑම අභියෝගයකට මුහුණ දීම සඳහා ඉදිරි ගමන් මග පිළිබඳව සවිස්තරාත්මකව සංවාද සිදු කෙරේ. මේ අතර, හිතකර මූල්‍ය පද්ධතියක් පවත්වා ගැනීම පිණිස අර්බුද සඳහා පෙර සූදානම් වීම සහ සම්බන්ධීකරණය අසාර්ථක වීමේ අවදානම් අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, **මහ බැංකුව මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුව සහ මූල්‍ය පද්ධති අධීක්ෂණ කමිටුව හරහා, රජය සහ නියාමන ආයතන ඇතුළු අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරයි.**

මීට අමතරව, ගරු ජනාධිපතිතුමා හා මුදල් අමාත්‍යවරයා සහ නියෝජ්‍ය අමාත්‍යවරුන් සමඟ මහ බැංකුකරණයට අදාළ විවිධ කරුණු සහ ඒ ආශ්‍රිත ආර්ථික හා මූල්‍ය ගැටලු සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවල දී සාකච්ඡා පවත්වනු ලැබේ.

විශේෂයෙන්ම මහ බැංකුවේ ක්‍රියාමාර්ග සහ ඒවායේ බලපෑම්, සහ මහ බැංකුවට අදාළ විෂයයන් විස්තර කිරීම සඳහා, මහ බැංකු පනතේ විධිවිධාන පරිදි සහ ඉල්ලීමක් මත, මහ බැංකුවේ ප්‍රධාන නිලධාරීහු පාර්ලිමේන්තුවේ කාරක සභා ඉදිරියේ පෙනී සිටිති.

වසර කිහිපයක අර්බුද හා අවිනිශ්චිතතාවෙන් පසු ආර්ථිකය සාපේක්ෂව සාමාන්‍ය කාලපරිච්ඡේදයකට අවතීර්ණ වනු ඇතැයි අපේක්ෂා කෙරෙන බැවින් ඉදිරියේ දී ද, එවැනි රාජ්‍ය මූල්‍ය, මුදල් සහ මූල්‍ය පද්ධති ප්‍රතිපත්ති සම්බන්ධීකරණය අඛණ්ඩව පවත්වාගෙන යාම එක සේ වැදගත් වේ. හිතකර ප්‍රතිපත්ති සම්බන්ධීකරණය මගින් ස්ථාවර සාර්ව ආර්ථික වාතාවරණයක් ඇති කරනු ඇතැයි අපේක්ෂා කෙරෙන අතර, එය ආර්ථිකයේ ඵලදායීතාව සහ කාර්යක්ෂමතාව

ප්‍රවර්ධනය කිරීම සඳහා, පෞද්ගලික අංශය ද ඇතුළුව, ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ගේ ප්‍රමුඛ අවශ්‍යතාවක් වේ. එමගින් තිරසාර සහ සාර්ව සහභාගීත්වයකින් යුක්ත ආර්ථික වර්ධනයකට පහසුකම් සැපයෙනු ඇත.

## 6. සමාප්ති සටහන

දුෂ්කර වසර කිහිපයකින් පසු යථා තත්ත්වයට පත් වූ සාර්ව ආර්ථික සහ මූල්‍ය අංශයේ ස්ථාවරත්වය සමඟින් අද ශ්‍රී ලංකාව ශක්තිමත්ව නැගී සිටියි. එවැනිම තත්ත්වයන්ට මුහුණ දුන් අනෙකුත් රටවල් හා සසඳන විට ශ්‍රී ලංකාව බලාපොරොත්තු වූවාට වඩා වැඩි වේගයෙන් යථා තත්වයට පත් වූව ද, එම ස්ථාවරත්වය මැදි කාලීනව සිට දිගු කාලය දක්වා පවත්වා ගැනීම, අවශ්‍ය ආර්ථික ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට රටෙහි ඇති කැපවීම මත පදනම් වේ. වර්ධන විභවයන් වෙත ළඟා වීම සහ පවතින විභවයන් වැඩිදියුණු කරගැනීම සඳහා ආර්ථික වර්ධනයෙහි පරිවර්තනීය වේගයක් ඇති කර ගැනීම අත්‍යවශ්‍ය වේ. මෙමගින් රටේ ණය දැරීමට ඇති හැකියාව ද ඉහළ නැංවීමට සහාය ලැබේ. කම්පනවලට ඔරොත්තු දීමට හැකි වන පරිදි ස්වාරක්ෂක ගොඩනැගීම සහ ආර්ථික හා මූල්‍ය පද්ධති ස්ථායීතාවයට හානියක් නොවන පරිදි වර්ධනය වේගවත් කිරීම රටේ ඉදිරි ගමනට අත්‍යවශ්‍ය මීළඟ පියවරයි. මේ සඳහා, ආර්ථිකයට එහි විභවයන් කරා ළඟා වීමට සහාය වන අතරම, දේශීය මිල ස්ථායීතාවය පවත්වා ගැනීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ආරක්ෂා කිරීමෙහිලා සිය කාර්යභාරය මහ බැංකුව විසින් අඛණ්ඩව ඉටු කරනු ඇත.

**ඔබට තුති පුදන අතර සහ ඔබ සැමට ස්ථායීතාව සහ සෞභාග්‍යයෙන් පිරුණු සුබ වසරක් අපි ප්‍රාර්ථනා කරමු!**